# සිංහල ගී පොතක්

Asoka Don Liyanage

2013

Volume 2

www.studentlanka.com

This is the 2nd Volume of “ A Song Book You Can Sing or Play. ”

Click any song from the index page, it takes you to the page with the corresponding lyrics.

Play the song by using the link " අසන්න ගීතය "

Click any “ Page Number ” or “ Go to the index “ links , it takes you to the index page.

If you need the Volume 1 of this song book , please write to me.

asokal@gmail.com

අසෝක ලියනගේ
Mississauga , Ontario , Canada



www.studentlanka.com

This song book is dedicated to the Great Sri Lankan Singer Visharda Amaradeva who celebrated his 85th Birthday on 5th December 2012.

This book contains 2 songs he created at the age of 85.



www.studentlanka.com

| පටුන | ගායනය | ගීතය | පිටුව |
|---|---|---|---|
| 1 | විශාරද අමරදේව ( A Latest Song ) | ආදරයද මේ | 7 |
| 2 | විශාරද අමරදේව | ආදර හැඟුම් ආදර හැඟුම් | 8 |
| 3 | විශාරද අමරදේව | දරු දුක උහුලා | 9 |
| 4 | විශාරද අමරදේව | ජීවිතයේ තනි මංසල | 10 |
| 5 | විශාරද අමරදේව ( A Latest Song ) | ෆෙවණැලි මියයන හැන්දෑවේ | 11 |
| 6 | විශාරද අමරදේව | කරදර පොදි බැඳ | 12 |
| 7 | විශාරද අමරදේව | මා මළ පසු | 13 |
| 8 | විශාරද අමරදේව | මළ ඉර බසිනා | 14 |
| 9 | විශාරද අමරදේව | සඳකත් පිණි දිය | 15 |
| 10 | විශාරද අමරදේව | තරු අරුන්දතී | 16 |
| 11 | විශාරද අමරදේව | සුදු නෙළුම කෝ | 17 |
| 12 | අමරසිරි පීරිස් | අත් වැල ගිලිහී | 18 |
| 13 | අමරසිරි පීරිස් | දිගැසියේ දිගු නීල නයන | 19 |
| 14 | අමරසිරි පීරිස් | හන්තාන කඳු වැටිය | 20 |
| 15 | අමරසිරි පීරිස් | හිම දියවී හිමාලයේ | 21 |
| 16 | අමරසිරි පීරිස් | ඉකි ගසා හඬන | 22 |
| 17 | අමරසිරි පීරිස් | කාත් කවුරුවත් නැති | 23 |
| 18 | අමරසිරි පීරිස් | ළඳුනේ | 24 |
| 19 | අමරසිරි පීරිස් | මල් සුවඳට බඹරු එනව | 25 |
| 20 | අමරසිරි පීරිස් | මේ හිතට දුක දැනෙනා වෙලාවයි | 26 |
| 21 | අමරසිරි පීරිස් - දිල්රුක්ෂි ජයකොඩි | ඔබ එදා නම් සඳ | 27 |
| 22 | අමරසිරි පීරිස් | රාධා | 28 |
| 23 | අමරසිරි පීරිස් | රතු රෝස මල් යායේ | 29 |
| 24 | අමරසිරි පීරිස් | සඳ එනකොට | 30 |
| 25 | අසංක පියමන්ත - මාලිනි බුලත්සිංහල | සඳ දිය දෙවුන සේ | 31 |
| 26 | Centigradez | මගෙ ආදරේ මදි වුනාද | 32 |
| 27 | Centigradez | නිල සඳ මඬල | 33 |
| 28 | චාමර වීරසිංහ | මේ තරම් සුසුම් දරා | 34 |
| 29 | චන්දන ලියනාරච්චි | සුවඳ මට දී | 35 |
| 30 | චන්ද්‍රලේඛා පෙරේරා | මුතු පබළු වළාවේ | 36 |
| 31 | චින්තක ජයසිංහ | ගව් ගණනක් ඈත සිටන් | 37 |
| 32 | දමිත් අසංක | මේ අනන්ත රාත්‍රියේ | 38 |
| 33 | දයාරත්න රණතුංග අමරා රණතුංග | මහ රෑ යාමේ | 39 |
| 34 | දයාරත්න රණතුංග | සරසවියේදී හෙට විතරයි | 40 |
| 35 | දීපිකා ප්‍රියදර්ශිනී | මේ තනි යහනේ | 41 |




www.studentlanka.com

| | | | |
|---|---|---|---|
| 36 | දීපිකා ප්‍රියදර්ශිනි | පිතු සෙනෙහේ | 42 |
| 37 | එඩ්වර්ඩ් ජයකොඩි | අන්න බලන් සඳ | 43 |
| 38 | එඩ්වර්ඩ් ජයකොඩි | බුදු බණක් කියන්නට | 44 |
| 39 | ගුණදාස කපුගේ | මාරියාවේ | 45 |
| 40 | ගුණදාස කපුගේ | නින්ද නැති රැයේ | 46 |
| 41 | ගුණදාස කපුගේ | උන්මාද සිතුවම් | 47 |
| 42 | හර්ෂණ පෙරේරා | සඳ පැයුවා එක දවසක් | 48 |
| 43 | MiLiN | පායා ඇයි හිනැහෙන්නේ | 49 |
| 44 | ඉන්ද්‍රානි බෝගොඩ | විදුලිය එළිය දැක | 50 |
| 45 | ජානක වික්‍රමසිංහ | පිරිත් පොත සේ පිවිතුරුයි | 51 |
| 46 | කරුණාරත්න දිවුල්ගනේ | සමනල වැව පුරවන්නට | 52 |
| 47 | කරුණාරත්න දිවුල්ගනේ | හිටියා එදා නම් | 53 |
| 48 | කරුණාරත්න දිවුල්ගනේ | පෙම් කවක් ලියූ නුඹ | 54 |
| 49 | කරුණාරත්න දිවුල්ගනේ | විදිම් දඬුවම් | 55 |
| 50 | කරුණාරත්න දිවුල්ගනේ | සුදු බංඩි | 56 |
| 51 | කසුන් කල්හාර ඉන්ද්‍රචාපා ලියනගේ | ආදර මල් වල | 57 |
| 52 | කසුන් කල්හාර | මීදුම් දුමාරයේ | 58 |
| 53 | කසුන් කල්හාර | සඳ සඳ වගේ | 59 |
| 54 | කිංස්ලි පීරිස් | මේ දෑස දුක් විදි | 60 |
| 55 | කිත්සිරි ජයසේකර (ඔලු 1 ටෙලි ) | හැර දමා යන මේ නිමේෂය | 61 |
| 56 | කිත්සිරි ජයසේකර (නටු නැති මල් ) | සඳ කැරළි ගල ගලා | 62 |
| 57 | ක්‍රිෂාන්ත එරන්දක මාලිනී බුලත්සිංහල | මගෙ ආදර පවසට | 63 |
| 58 | ක්‍රිෂාන්ත එරන්දක මංජුලා නිමන්ති | ලියූ කවි පද | 64 |
| 59 | කුෂානි සඳරේඛා | කුරුල්ලෝ ඔබේ තාලෙන් | 65 |
| 60 | ලහිරු පෙරේරා | ලබැඳියේ | 66 |
| 61 | මිල්ටන් පෙරේරා | සුපුන් සඳක් නැගීලා | 67 |
| 62 | නන්දා මාලිනි ( මේකලා ගමගේ ) | අහස සේ ඔබ අනන්තයි | 68 |
| 63 | නන්දා මාලිනි | බුදු කරුණා දෑස තෙමී | 69 |
| 64 | නන්දා මාලිනි | කඩමණ්ඩියේ | 70 |
| 65 | නන්දා මාලිනි | කුරුටු ගෑ ගී පොතේ | 71 |
| 66 | නන්දා මාලිනි | මගේ සඳ ඔබ | 72 |
| 67 | නන්දා මාලිනි | ශාන්ත මේ රාත්‍රියේ | 73 |
| 68 | නන්දා මාලිනි | සුදු හාමිනේ | 74 |
| 69 | නාරද දිසාසේකර | ආදර නිල් දෑසේ | 75 |
| 70 | නාරද දිසාසේකර නන්දා මාලිනි | ගලන ගඟකි ජීවිතේ | 76 |
| 71 | නරි බෑනා ගායක | කුමටද සොබනියෙ | 77 |
| 72 | නෙලු අධිකාරී | සිනහවකට වඩා ඔබේ | 78 |
| 73 | නිරෝෂා විරාජිනී | සුදු ඇත් පොව්වෙක් | 79 |
| 74 | ප්‍රින්ස් උදය ප්‍රියන්ත | සීගිරියේ කුරුටු ගීත | 80 |




www.studentlanka.com

| | | | |
|---|---|---|---|
| 75 | රොෂ්ඩනි වර්ණකුල (රතු හැට්ට කාරී ) | යස ඉසුරු පිරුණු තැනා | 81 |
| 76 | රොනල්ඩ් ෆ්‍රැන්සිස් | ඔබ මට ඇතයි | 82 |
| 77 | රොහාන් ශාන්ත බුලේගොඩ | සඳක් නම් | 83 |
| 78 | රෝහණ සිරිවර්දන | දේව මන්දිරේ | 84 |
| 79 | රුකාන්ත ගුණතිලක | උකුලට නාවත් එදා වගේ | 85 |
| 80 | සනත් නන්දසිරි | බෝ මළුවේ මල් | 86 |
| 81 | සනත් නන්දසිරි | මේ ප්‍රථම වසන්තයි | 87 |
| 82 | සනත් නන්දසිරි | සොවින් පිරි මගේ හදවත | 88 |
| 83 | සේනානායක වේරලියැද්ද | මීන නුවන් යුග | 89 |
| 84 | සේනානායක වේරලියැද්ද | නන්දනීය පෙම | 90 |
| 85 | ශාලිත අබේවික්‍රම | පිපුණු මලක | 91 |
| 86 | සිසිර සේනාරත්න | මාගේ පුතුට මල් | 92 |
| 87 | සෝමතිලක ජයමහ | අපි ආයෙත් හමු නොවුනා නම් | 93 |
| 88 | සුජාතා අත්තනායක | පරවුණු මල් වල | 94 |
| 89 | සුනිල් එදිරිසිංහ | අලුත් වැස්සක් | 95 |
| 90 | සුනිල් එදිරිසිංහ | කුඩා ගමේ මද්දහනේ | 96 |
| 91 | සුනිල් එදිරිසිංහ | මහ වැස්සක් බිමට හලා | 97 |
| 92 | සුනිල් එදිරිසිංහ | පාරු පාලමෙන් | 98 |
| 93 | සුනිල් එදිරිසිංහ | පැන මැඩ කඩිති | 99 |
| 94 | සුනිල් එදිරිසිංහ | රන්මැලි සැය විය | 100 |
| 95 | සුනිල් ශාන්ත | දිය ගොඩ හැම තැන | 101 |
| 96 | ටි. එම. ජයරත්න | අම්මා සඳකි | 102 |
| 97 | වික්ටර් රත්නායක ශ්‍රීමති තිලකරත්න | ආදර ගඟුලේ | 103 |
| 98 | වික්ටර් රත්නායක | අපි ඇතට ඇතට | 104 |
| 99 | වික්ටර් රත්නායක | අපි හැඟුම් වලට | 105 |
| 100 | වික්ටර් රත්නායක | මල් ලියකම් රැඳි | 106 |
| 101 | වික්ටර් රත්නායක | සිහින සතක් දුටුවෙමි | 107 |
| 101 | උමාරා සිංහවංශ | වස්සානයට අත වනල | 108 |
| 102 | W.D. ආරියසිංහ | මා ළඟටම තව ලං වෙලා | 109 |
| 103 | Links to music sites. | | 110 |
| | | | |





www.studentlanka.com

# විශාරද අමරදේව - ආදරයද මේ

ගිමන් හරින දියඹ දිගේ සුසුම් හෙලන වෙරළ ඉමේ
බැසයන හිරු අඩසි සඳක රහස් කියනවා
සඳ ආදරයෙන් අහස පුරා රටා මවනවා

සිත් දැහැනේ වෙලි තිබුණු නෙත් දැහැනේ ගලා හැලුණු
මියැදෙන්නට බලා ඉඳපු ආදරයද මේ
නිල් අහසේ ලියා දුන්න ආදරයද මේ

නිල් කටරොළු නිල ගැවුණු
මල් දළ මුදු සුව රැඳවුනු
තොල් පෙති කල් හල ගාලන ආදරයද මේ
නුඹ රහසේ කියා දුන්න ආදරයද මේ

ගිමන් හරින දියඹ දිගේ.......

අසන්න ගීතය

පද - ජානක සිරිවර්ධන සංගීතය - අරුණ ගුණවර්ධන



www.studentlanka.com

# විශාරද අමරදේව - ආදර හැඟුම් ආදර හැඟුම්

ආදර හැඟුම් ආදර හැඟුම් නුපුරුදුයි මට ඒ හැඟුම්
ආදර හැඟුම් ආදර හැඟුම් ආදර හැඟුම්
කිති කවයි හද කිති කවයි ඒ හැඟුම්

ආදර හැඟුම් ආදර හැඟුම් ආදර හැඟුම්

සැදා අඳුරේ සැලෙන තරු එලි මගේ හද තුල කරයි විමසිලි //
නැගෙන ගණඳුර වඩයි සිතුවිලි
මේ මගුල් රෑ බිඳෙයි ඉවසිලි

ආදර හැඟුම් ආදර හැඟුම් ආදර හැඟුම්

කිමද පොබ මල් කුමරියන්නේ
පෙති විදා සතුටින් නොඉන්නේ
රහස නැතුවද මං නොදන්නේ
තුරුළේ බඹරුන් නොවේද ඉන්නේ

[අසන්න ගීතය]



www.studentlanka.com

# විශාරද අමරදේව - දරු දුක උහුලා

දරුවන් තුරුල්ලේ ඉන්නා කලේයා
දරු සැප තරම් අන් නිවනක් නොවේයා
දරු ගින්දර හද හදවත දැවේයා
දරු දුක තරම් ගින්නක් ලොව නැතේයා

දරු දුක උහුලා තනිව වැළපෙනා
බුදු බව ලබනා පියවරු වෙසෙනා
පූජා.... පූජා වේවා

මහ මෙර වැනි බර සිතින් උහුලනා
කඳුලැලි සමුදුර නෙතින් සඟවනා
දරු දුක උහුලා තනිව වැළපෙනා
බුදු බව ලබනා පියවරු වෙසෙනා
පූජා... පූජා වේවා

මව් ඇති දාටත් සෙනෙහස පුරනා
මව් නැති දාටත් තුරුලේ රකිනා
සසර ගෙවෙන තුරු දරුවන් රකිනා
බුදු බව ලබනා පියවරු වෙසෙනා
පූජා..... පූජා වේවා

අසන්න ගීතය

පද - ධර්මසිරි ගමගේ මැතිතුමා
සංගීතය - ආචාර්ය ප්‍රේමසිරි කේමදාස



www.studentlanka.com

# <u>විශාරද අමරදේව - ජීවිතයේ තනි මංසල</u>

ආ රා ධ නා ආ රා ධ නා
ජීවිතයේ තනි මංසල අතරමං වෙලා
හුදෙකලාව සුසුම් හෙලන හදවත සනහා
අතීතයේ ගිලිහී ගිය සතුට රැගෙන යළි වඩින්න

ආ රා ධ නා ආ රා ධ නා

නෙලු සුපෙම් කැටයම් හද පවුරු තලාවේ
මැකී ගියාදෝ.... කාලයේ වෙරළේ
ජීවිතයේ දිගු ගමනින් අනාත වූ දා
සෙනේහයේ සත් පියුමන් යළිදු පිපේවා

ආරාධනා ආරාධනා

එදා සිහිනි කිරි සුවඳින් යුග දිවි අරණේ
ඔබේ උණුසුමේ.... යළිදු උපන්නෙමි
බිඳුණු එවන් රජ දහනින් සමුගෙන යනදා
ඔබේ නුවන් පහනින් යළි එළිය ලැබේවා

අසන්න ගීතය

පද - කුලරත්න අරියවංශ සංගීතය - රෝහණ වීරසිංහ



www.studentlanka.com

# විශාරද අමරදේව - හෙවණැලි මියයන හැන්දෑවේ

හෙවණැලි මියයන හැන්දෑවේ
ඉර උඩ ඉඳගෙන ඈත බලා ඉන්නේ
සීපද මුමුණන්නේ ඒ හඩ ඇසෙනවා දෝ
නෙත් යුග තෙත් වෙන්නේ ඒ දුක දැනෙනවදෝ

වැලි බත් ඉවූ මිදුලේ පළගැටියන් රජ වී
පුතු ගැන සිහිවෙනවා මතකය බොඳ වෙනවා

හෙවණැලි මියයන හැන්දෑවේ........

මගේ හිරු මියෙන වෙලේ ඔබෙ හිරු ඉපදෙනවා
නෙතු පියවෙන්න කලින් එනවද මගේ පුතුනේ

අසන්න ගීතය

පද - මෛත්‍රී පනාගොඩ සංගීතය - රෝහණ වීරසිංහ



www.studentlanka.com

# විශාරද අමරදේව - කරදර පොදි බැඳ

කරදර පොදි බැඳ ගැල පිට පටවා
කරුමයේ කළු ගොනු පෙරටුවේ බැඳගෙන
මේ ජීවන මග අප යනවා
ඒ ගමනේ දුක් දාහී නිවාලන

සීපද මුවඟින් පිට වෙනවා //

අප යන මේ මඟ කළුගල් මතු වී
පය රත් වීලා බුබුළු නැඟෙන සඳ
දෑසින් කඳුළැලි පිටවෙනවා
ඒ ගමනේ දුක් දාහේ නිවාලන

සීපද මුවඟින් පිට වෙනවා //

කිරිගල්පොත්තේ කන්ද නගින විට
ගම සිටිනා ඔබ හදේ ඇදෙනවා
ඒකෙන් ගමනට හිත දෙනවා
ඒ ගමනේ දුක් දාහේ නිවාලන

සීපද මුවඟින් පිට වෙනවා //

අසන්න ගීතය

පද - මහගම සේකර සංගීතය - විශාරද අමරදේව



www.studentlanka.com

# විශාරද අමරදේව - මා මළ පසු

මේ ලොව යම් කිසිවකු මා හට පෙම් කළ බව
එතකොට ඒ ගී රාවය හීන් හඬින් මට කියාවි

මා මළ පසු සොහොන් කොතේ
දුක් ගීයක් ලියනු මැනව ///

නන්නාඳුනනා ඔබගේ
අත් අකුරින් ලියනු මැනව
දුක් ගීයක් ලියනු මැනව

අඩසඳ බැස ගෙන යන සඳ සීතල අඳුරු රැයක //
රැහි හඬන රැව් අතරින්
එතකොට ඒ ගී රාවය
යාන්තමින් මට ඇසේවි

අසන්න ගීතය

පද - මහගම සේකර සංගීතය - සෝමදාස ඇල්විටිගල



www.studentlanka.com

# විශාරද අමරදේව - මළ ඉර බසිනා සැන්දෑ යාමේ

මළ ඉර බසිනා සැන්දෑ යාමේ ඔබගෙන් සමුගන්නම්
අඳුරට ඉඩ දී අඳුරේ සැඟවී
ඔබගෙන් වෙන්වී මම යන්නම්

නිදි නැති යාමේ රෑ යාමේ කාන්සියේ ඔබ හිඳිනා වේලේ
සුළඟේ දැවටී ඔබට හොරෙන් මම ඔබ වෙත එන්නම්
සියුමැලි දෑතින් ඔබ හිස අතගා
ඔබ නිදි කරවා මම යන්නම්

අළුයම පිබිදෙන ඔබගේ දෑසේ //
මල් පෙති අග පිණි කඳුලක් රඳවා
සුසුමක් වාගේ ඉන් පිටවී //
ඔබගෙන් වෙන් වෙන්නම්

අඳුරට ඉඩ දී අඳුරේ සැඟවී //
ඔබගෙන් වෙන්වී මම යන්නම් //

අසන්න ගීතය

පද - මහගම සේකර සංගීතය - විශාරද අමරදේව



www.studentlanka.com

# විශාරද අමරදේව - සඳකත් පිණි දිය

සඳකත් පිණි දිය දියවී ගලනා සීතල කඳු අතරේ
හද ගොළුවී ඉකි බිඳ ඔබ හඬනා හඬ මා සවනේ පෑදේ

නිසංසලේ රෑ අහසේ නිසංසලේ රෑ ඝන බොල් අහසේ
මිලාණ වූ තරු එළියේ ඔබේ නුවන් මිණි පහන් නැගී
ඇවිලේ මා දෑසේ

සුසුම් හෙලන තුරු ලතා ළපල්ලේ සිහිල් සුළඟ හා වෙලී
මගේ කවුළු දොර තුලින් එබී ඔබ සොයා ඇදේ

අසන්න ගීතය

පද - මහගම සේකර

සංගීතය - ලයනල් අල්ගම



www.studentlanka.com

# විශාරද අමරදේව - තරු අරුන්දතී

තරු අරුන්දතී නෙතු පහන් නිවා දුර නිසොල්මනේ හිදිනා
මග වනස්පති ලිය ළදල්ලකින් පිණි පොදක් සෙමෙන් සළනා

ඔබ සැමරුම් රැළි කව්ළුව මානේ කඳුලක පැල්ලම් එහි ඇඳුනා
අළුත් මලින් පිරි වනෝද්‍යායානේ සැදෑ බොල් සුළගේ
මට තනියක් දැනුනා

තරු අරුන්දතී නෙතු පහන් නිවා දුර නිසොල්මනේ හිදිනා
ඔබ කවුළු පියන් හැර පාන්දරින් කොහෙ ගියේද මට හිතුනා

වැළපෙන මා හද කැටපත් පවුරේ හංස ගීතය ලියැවෙනදා
පළමු අරුණු රන් රේඛාවක් සේ ප්‍රර්ථනා සුවදේ
ඔබ එතැයි සිතුනා

පිපි මලින් මලේ රොන් සුනු විසිරී හද රිදී සුසුම් නඟනා
ඔබ කවුළු පියන් හැර පාන්දරින් කොහෙ ගියේද මට හිතුනා

අසන්න ගීතය



www.studentlanka.com

# විශාරද අමරදේව - සුදු නෙළුම කෝ

සුදු නෙළුම කෝ සොරබොර වැවේ
මල් සුවඳ දුන් මහියංගනේ
පුන් පෝයදා පාලොස්වකේ මල් නෙලා විකුණූ පන්සලේ

වැවට කළුවර යාවුනා සංසාර දුක බෝ වුනා
නෙලුම් මල් ටික ඉහිරුනා එහා ඉවුරට පා වුනා

සුදු නෙළුම කෝ.........

සිහින් සිරිපොද වැහුනා ඉවුරු දෙකපොල සේදුනා
සුදු නෙලුම් මල දැස පියවී මෙහා ඉවුරට පාවුනා

සුදු නෙළුම කෝ.........

අසන්න ගීතය

පද - රත්න ශ්‍රී විජේසිංහ



www.studentlanka.com

# අමරසිරි පීරිස් - අත් වැල ගිලිහී

අත් වැල ගිලිහී ලොව තනි වූ දා
දකිනා පෙර මග ලකුණු නැතී
ආශා දැහැනේ වැනසී යාදෝ
යුග දිවි ගමනේ සොඳුරු ගතී

උසුලනු හැකි වෙද තන්හා ආශා
සඟවනු හැකි වෙද සිතුවිලි මාලා
ඉවසනු හැකි වෙද සෝ දුක් සංකා
ආශා දැහැනේ වැනසී යාදෝ යුග දිවි ගමනේ සොඳුරු ගතී

දෑඟිලි එක් කල වරපට දෙදරා
සෙනෙහස වැපුරූ සරු කෙත වනසා
පුහුදුන් හදවත සෝ ගිනි දල්වා
ආශා දැහැනේ වැනසී යාදෝ යුග දිවි ගමනේ සොඳුරු ගතී

අසන්න ගීතය



www.studentlanka.com

# අමරසිරි පීරිස් - දිගැසියේ දිගු නීල නයන

දිගැසියේ දිගු නීල නයන නිල් විලේ පිහිනා යන්නට
අවසර ඇත්නම් අවසර ඇත්නම්
සඳ දියේ සඳ සිහිල සිඹින
තරු ඇසේ මුදු සිහින පතක දැවටී ඉන්නම්

ගිම් නිවා ගිම්හානයේ මල් පොකුරු පුරෝගෙන
ලිය මඩුලු රටා ලියනා හසකැන් දිහා වස්සානයේ
ඇවිදන් යන්න යමු ප්‍රේමියේ

දිගැසියේ දිගු නීල නයන ............................

තටු සලා නිල් ආකහේ පවනැල්ලේ එතීගෙන
සිත් කවුළු පියන් හරිනා සුවඳින් ඔබේ
කිඳුරාවියේ හැඟුමන් දෙන්න කල්පාන්තයේ

[අසන්න ගීතය]

පද - ප්‍රභාත් වෙත්තසිංහ සංගීතය - නවරත්න ගමගේ



www.studentlanka.com

# අමරසිරි පීරිස් - හන්තාන කඳු වැටිය

හන්තාන කඳු වැටිය එදා වාගෙයි අදත්
මහවැලිය පුරුදු සේ ගලා යාවී හෙටත්
සරසවියෙ තුරු වදුලු මිලින වී නෑ තවත්
එත් අද කුමරියේ ඔබ කොහිද මා කොහිද

එදා අප පෙම් වදන් දෙඩූ ලිය මඬුලු යට
පෙම්වතුන් පෙම් වදන් දොඩනවා
අප සමග එදා සිටි අවන් හල දෙසුම් හල
පුරුදු සේ බලාගෙන ඉන්නවා

හන්තාන කඳු වැටිය........

මේ බිමේ සැඟව ඇති සිවු වසක අතීතය
යලි යලිත් මතකයට නැගෙනවා
මහත් වෙහෙසක් දරා සඟවන්න තැත් කළත්
නෙතු අගට කඳුළු බිඳු නැගෙනවා

හන්තාන කඳු වැටිය........

අසන්න ගීතය

පද - උපාලි මල්දෙනිය සංගීතය - ඩෙනිස්ටර් පෙරේරා



www.studentlanka.com

# අමරසිරි පීරිස් - වසන්තා තිලකාංගනී
# හිම දියවී හිමාලයේ

හිම දියවී හිමාලයේ යමුනා ගඟ නගයි තරංගා
සුදු පෙණ කැටි බලන්න රාධා
සුළඟ හමයි සීතල සාදා
සීතල ගිනි ගනීද ක්‍රිෂ්ණා

සිනා රැළි නගා උතුරන ඔය හදවත් නීල ජලාසේ
පීනන මේ ස්වර්ණ හංසයෝ අකීකරුද මෙතරම් රාධා
ඉඩ දී දෙන්නට දඬුවම් දෑස පියා ගන්නම් ක්‍රිෂ්ණා
හිම දියවී හිමාලයේ ................

මල් පෙති පොඩි වී ඉකිලන මේ හෝපලු යහන් තලාවේ
සඳ දිය මිණි මෙවුලට වැටිලා දෑස නිලංකාරයි රාධා
ගිලිහී ගියදෙන් මිණිකැට දෑස වසා ඉන්නම් ක්‍රිෂ්ණා

හිම දියවී හිමාලයේ ................

අසන්න ගීතය



www.studentlanka.com

# අමරසිරි පීරිස් - ඉකි ගසා හඬන

ඉකි ගසා හඬන අතීතයක
කඳුළ එක්ක ගනුදෙනු කරනා
මට මගේ නොවන මගේම ආදරයක් තිබුනා

හීනෙන් හිනැහී තුන්යම මා රවටා
මැදියම් මහා රෑ අදටත් හිත ඉගිලෙනවා
නින්දෙන් ඇහැරී කලුවරේම යලි සොයනා
මට මගේ නොවන මගේම ආදරයක් තිබුනා

රිදුමක් වාගේ කිසිදා සුව නොවෙනා
සුසුමින් විතරක් නිරතුරුවම පිරි මදිනා
උහුලනු බැරි තැන උණු කඳුළම වගුරුවානා
මට මගේ නොවන මගේම ආදරයක් තිබුනා

[අසන්න ගීතය]

සංගීතය - දර්ශන දිසානායක



www.studentlanka.com

# අමරසිරි පීරිස් - කාත් කවුරුවත් නැති

කාත් කවුරුවත් නැති බව දැන දැන
මාත් මගේ හිතත් රාත්‍රියක තියලා
නුඹත් ගියානම් හෙටත් තියේවිද
මටත් හිරක් නැගෙනා

සාංකාව ඇහැරෙන ගණ අඳුරේ
ආත්මයම මගේ රාත්‍රියම වැන්නේ
ඇත් වෙන්න නම් ඇයි තුරුලේම උන්නේ

වේදනවා ඇවිලෙන දිවි කතරේ
දෑස් ඇරන් හිඳ තවත් පලක් නැත්තේ
එත් කියන්නම් හමුවෙමු මතු භවයේ

අසන්න ගීතය

පද - අමිල තේනුවර සංගීතය - දර්ශන රුවන් දිසානායක



www.studentlanka.com

# අමරසිරි පීරිස් - ළඳුනේ

ළඳුනේ ළඳුනේ
ඔබේ දෑස දැක ගත්තෙමි සැදෑ කලෙක ළඳුනේ
දෙනෝ දහක් අත ගත්තද සැමියෙකු නැති ළඳුනේ
නැයෙක් නෑ කම නොකියන වීදි සරණ ළඳුනේ ළඳුනේ

තෙල් මල් ගෙන දෝත පුරා මුනි කුටියට පියමං වන
ඔබේ දෑස දැකගතෙමි සැදෑ කලෙක ළඳුනේ

බුදුන් දැක නිවන් දකිමයි දෙවරම යන පාර අහන
ඔබද පටචරාවකි ඔබද කිසා ගෝතමියකි

පිරිමින්ගේ පාප කඳට දෝස විඳින ළඳුනේ
අඳුරේ පව් කරන දනා එළියේ රවන ළඳුනේ

ලැම පමණක් ලොවට පෙනෙන ලය නොපෙනෙන ළඳුනේ
කුහුඹුවකුට වරදක් නැති වැරදි කාර ළඳුනේ

අසන්න ගීතය

පද - රන්බණ්ඩා සෙනෙවිරත්න
සංගීතය - ආචාර්ය ප්‍රේමසිරි කේමදාස



www.studentlanka.com

# අමරසිරි පීරිස් - මල් සුවඳට බඹරු එනව

මල් සුවඳට බඹරු එනව බඹර නදට නෙත් වැහෙනවා
බලාගෙනයි සුවඳ රේණු බිමට හැලෙවී
ධවල අසුගේ පිට නැගිලා තරු යායේ මල් නෙලන්න
බලාගෙනයි සිහින පොදිය බිමට ඇදේවී

දේදුන්නේ පාට ගාල නළ කුමරුගේ රූපේ ඇඳල
දමයන්තිය වෙන්නද නුඹ හීන මවන්නේ
දේදුන්නේ පාට මැකී නා කපනා වැහි වැටුනම
දඟ කරනා සමනලියන් නොවේද තෙමෙන්නේ

හීන පොලේ හැමදාමත් පාට හීන නිල් බොහොමයි
දොයිතුව නැති අපි කොහොමද කහවනු දෙන්නේ
වලාකුලෙන් සඳලුතලෙන් හීන් සැරේ බිමට වරෙන්
නුඹ එන තුරු මම ඉන්නම් වෙල් ඉපනැල්ලේ

[අසන්න ගීතය]

පද - උපාලි ජයමාන්න සංගීතය - ඩෙනිස්ටර් පෙරේරා



www.studentlanka.com

# අමරසිරි පීරිස් - මේ හිතට දුක දැනෙනා වෙලාවයි

මේ හිතට දුක දැනෙනා වෙලාවයි
මේ හිතට දුක හිතෙනා වෙලාවයි
මේ හිතට දුක දැනෙනා වෙලාවයි
මේ හිතට කවි හිතෙනා වෙලාවයි

විෂ මතක පොවා හී පහර එවා
නුඹ ගෙනෙන්නේ නිරතුරු රිදවුම්
සර පහර වැදී හද සිදුරු වෙවී
මේ ගලන්නේ වැගිරී කවිකම්

ගැල් බරට ගෙනා දුක් කඳුළු දරා
යම් දිනයක වන මුත් මිහිදන්
දෙව් ලොවට පවා මතු සුවඳ ගෙනේ
මල් පර සතුවන් මේ රිදවුම්

අසන්න ගීතය



www.studentlanka.com

# අමරසිරි පීරිස් දිල්රුක්ෂි ජයකොඩි
# ඔබ එදා නම් සඳ

ඔබ එදා නම් සඳ වගේ මැයි
ඔබ මෙදා හිරු වී මා දවයි
ඔබ මගේ යයි මට තව මට සිතෙයි
ඔබ දමා යන්නට හිත කියයි
ඔබ එදා නම් සඳ වගේ මැයි

නෙතේ නෑ ආදර බැලුම් කොහි සැඟවුනාදෝ නෙත් කැලුම් //
ඔබේ ලෝකය නොවේ මගේ ලොව
මැකී යයි ආදර හැඟුම්

ඔබ එදා නම් සඳ වගේ මැයි .................

පිටු පුරා පෙම් කවි ලියූ සිත ගොළු වුනේ ඇයි රස මැවූ //
නොදන්නෙමි වැරදුනේ කොතැනද
දෛවය ද මේ අප පැතූ

ඔබ එදා නම් සඳ වගේ.............................

අසන්න ගීතය



www.studentlanka.com

# අමරසිරි පීරිස් - රධා

ඔබ හඬනවා නම් මහ හයියෙන් හඬන්න රාධා
මට ඇහෙන දුරින් හිඳින්න රාධා
සිහින වෙලා රෑ තිස්සේ නොපෙනෙයි රාධා
මට පේන දුරින් ඔබේ සුසුම විඳින්න රාධා

ළඟට වෙලා තුරුළු වෙලා ඔබේ සුසුම විඳින්න රාධා
දුර ආකාසේ තරු අතරේ නොඉන්න රාධා
මගේ නෙත් අතරේ රශ්මිය වී හිඳින්න රාධා
පුර හඳට මුවා වෙලා හොරෙන් නොපෙනී රාධා
මගෙ උරහිස මත අටවක දා නිදන්න රාධා

ඔබ හඬනවා නම් මහ හයියෙන් හඬන්න රාධා
ළඟට වෙලා තුරුළු වෙලා ඔබේ සුසුම විඳින්න රාධා
මලක් වෙලා අර අතු අග නොපෙනී රාධා
මා ළඟම පිපී සුවඳ දිදී හිඳින්න රාධා
ජීවිතයම ගිනියම් දීර්ගතම රාත්‍රියයි මේ රාධා
මට පේන දුරින් හිඳින්න රාධා

අසන්න ගීතය ( Won the " Best visual of the year " 2011. )

පද සහ සංගීතය - ජගත් විජේවීර



www.studentlanka.com

# අමරසිරි පීරිස් - රතු රෝස මල් යායේ

රතු රෝස මල් යායේ මුදු සීත පිණි වැහේ
ඔබ හා මෙමා ගෙවූ ඒ යුගේ සිහිවී
කඳුළැල් ලෙසින් මුදු සීත පිණි වැහේ

ගං හෝ සිඳී වියැළී පිපි මල් සැලී මැලවී
සඳ තාරකා නොනැගී නිදා තනි වී හිඳී අඳුරේ

රතු රෝස මල් යායේ .................

බොඳ සීත සඳ එළියේ සැමරුම් ලෙසින් පාවී
ඔබගේ කතා සිහිනෙන් අසා දෙනුවන් හිඳී නොනිඳා

රතු රෝස මල් යායේ .................

[අසන්න ගීතය]

පද - කුමාරදාස සපුතන්ත්‍රී සංගීතය - රෝහණ වීරසිංහ



www.studentlanka.com

# අමරසිරි පීරිස් - සඳ එනකොට

සඳ එනකොට ගෙට රිංගාපන්
සඳ එලිය ඇවිත් මුහුණ සිප ගනී
එතකොට මට හුහක් දුක හිතෙයි
හිත රිදුනොත් නුඹට පව් පිරෙයි

හරිම හරි දඟයි කෙහෙරැල්ල මුරන්ඩුයි
එතකොට මට හරිම හරි බයයි
හිත මුරණ්ඩු වේදෝ නුඹ පිට ගම් යාදෝ
මගෙ සිත්විලි අතුරක යන ගානයි //

සඳ එනකොට ගෙට රිංගාපන් ......

බඹරු හරි වසයි මල් වලට කෑදරයි
නුඹත් මලකි මගේ හිත බරයි
මගේ රත්තරන් එකී හිත කැක්කුම් දේවි
මම හීන වලට හුරු නැති ගානයි

[අසන්න ගීතය](#)

පද - ලලිත් වසන්ත

සංගීතය - ජයසිරි අමරසේකර



www.studentlanka.com

# අසංක පියමන්ත මාලිනී බුලත්සිංහල
# සඳ දිය දෙවුන සේ

සඳ දිය දෙවුන සේ සිනහව පිපුනාම
නුඹ කොයි තරම් සුවඳද මගෙ සිත ගාව
දෑ කුල සිරිත් සිටි සඳ මඟ අවුරාන
හමුවී වැලපෙමුද මෙලෙසින් හැමදාම

නෑඹුල් පැතුම් අහසට නැග රහසේම
දිලිසෙන්නේ ද පුර පස වී සඳ ගාව
ඒ හඳ ඇයිද දියවකදී මුළු රෑම
දියවී ගිහින් රැඳුනේ තරු ඇස ගාව

සඳ දිය දෙවුන…………………

ලය මත පිපුණු උණුසුම් සුසුමක සුවඳ
සෝදා හල හැකිද ගැරහුම් රළ ගාව
කඩ ඉම ළඟ ඉඳන් වත් නුඹ හැමදාම
මට අත වනාපන් නලියන නල සේම

[අසන්න ගීතය]

පද - නිලාර් එන්. කාසිම් සංගීතය - සමන්ත පෙරේරා



www.studentlanka.com

# CENTIGRADEZ - මගේ ආදරේ මදි වුනාද

රෑ අහසේ තරු ගානට දුර විහිදෙන අනන්තයට
සංසාරේ පතා ආපු මගෙ ආදරේ මදි වුනාද
ඉහ නෙරියේ රැළි හදාපු සවන් පතට තෝඩු දාපු
ඔය දෙතොලට හාදු දීපු මගෙ ආදරේ මදි වුනාද

(ඔබෙ උකුලේ හිස තියාන සුරතලියේ හිත පුරාම
සඳ එළියේ පෙම් පුරාපු මගෙ ආදරේ මදි වුනාද) //

(මගෙ හිස නුඹ අත තියාන මං දිව්රා නුඹ කියාපු
ඒ ආදරේ නැති වුනාම මං ජීවත් වී හිඳී ද) //

(ඔබෙ උකුලේ හිස තියාන සුරතලියේ හිත පුරාම
සඳ එළියේ පෙම් පුරාපු මගෙ ආදරේ මදි වුනාද) //

[අසන්න ගීතය]

පද - සජිත් දිල්පහන්
සංගීතය - තුසිත් නිරෝෂන



www.studentlanka.com

# CENTIGRADEZ - නිල් සඳ මඩල

තනිරක්ක තනි රෝස මල් කල්පනා
විහිදෙන්න පොපියද්දි සුවඳක් වෙලා
නෙත් දෙක හුවමාරු කළ දුක් කතා
හිත් දෙකක හැප්පෙද්දී එක හිතක් වෙලා

පන්තාරුවක රිද්මෙ රැඳී - ගිහි පිරිතක් විදි ජීවිතේ
නිල් සඳ මඩලේ පලසේ එබේ - ඔබෙ ආදරය පින්තාරුවේ

පන්තාරුවක රිද්මෙ රැඳී - ගිහි පිරිතක් විදි ජීවිතේ
ඔබෙ ආදරය පින්තාරුවේ

(ඔබ නිදනා තුරු පපු තුරේ සුවඳ දෙයි සුසුමට මගේ
කඳුලෙන් කඳුලට ජීවිතේ හුස්ම දෙයි පරමාදරේ) //

අසන්න ගීතය

සංගීතය - තුසිත් නිරෝෂන



www.studentlanka.com

# චාමර වීරසිංහ (නිරෝෂ් ඉන්දික) මේ තරම් සුසුමන් දරා

මේ තරම් දුක් සුසුමන් දරා ඔබගේ හදින් වෙන් වුනා //
ඔබ කී ලෙසින් ඈත වෙන්වී ගියත් ඔබ නේද මා තව ළං කලේ//

සංසාරයේ මට ළං වෙලා
ඒ පැතුව පැතුමන් අප එක් වෙලා
ඔබ මෙලෙස ඇවිදින් මගේ ලෝකයේ
හැරදා ගියත් මෙලෙස මා මේ ලොවේ
ඔබ නේද මා තව ළං කලේ //

මාගේ ලොවින් වෙන්වී ගියත්
ඒ මතක සිතුවම් හදේ රූ ඇඳේ
කෙලෙසින්ද මා මෙලෙස ලොව තනි වුනේ
මගේ මතකේ හැරදා ඔබ නික්මුනේ
ඔබ නේද මා තව ළං කලේ //

මේ තරම් සුසුමන් දරා.............

අසන්න ගීතය

පද සහ සංගීතය - චමිල වර්ණ ජයලත්



www.studentlanka.com

# චන්දන ලියනාරච්චි - සුවඳ මට දී

සුවඳ මට දී පාට තැවරූ මල අරන් පිටවී
මා රැවටුවා මලවී ඒ මලත් මැලවී
ආදරේ මල අයෙමත් පරවී
සුවඳ මට දී

කුරුළු ගීතය වී පෙම් ස්වරය මට ඇසුනි
කුරුළු සර ගොළු වී මිහි මතේ තුරු කඩා වැටුණි

සුවඳ මට දී .........

ගඟට නාදය වී ඔබ ගලනවා ඇසුනි
සයුර නොම හමු වී අතර මග සිටිනවා දුටිමි

සුවඳ මට දී .........

[අසන්න ගීතය]

[Suwanda Mata Dee - Funny clip]



www.studentlanka.com

# චන්ද්‍රලේඛා පෙරේරා - මුතු පබළු වළාවේ

(මුතු පබළු වළාවේ මට සිසිල ගෙනාවේ
සැමදාම පතන්නේ ඔබෙ සෙවනයි කතරේ) //

දුර සිතිජ ඉමව්වේ දේදුන්න දිහාවේ //
නිරතුරුව දැනෙන්නේ ඔබෙ සිසිලද මෙලොවේ //

මුතු පබළු වළාවේ ......

රන් කුරුළු විමානේ දිය බුබුළු ජලාසේ //
නිරතුරුව දැනෙන්නේ ඔබෙ සිසිලද මෙලෙසේ //

මුතු පබළු වළාවේ ......

[අසන්න ගීතය]



www.studentlanka.com

# චින්තක ජයසිංහ - ගව් ගණනක් ඈත සිටන්

(ගව් ගණනක් ඈත සිටන් මා දිහාම හොරෙන් බලා
හිතේ මැවුණු සොඳුරු සීන ආදරේ තමයි) //

අහසේ පායනා තරු අතරින් දිදුලයි සඳු
එනමුදු ඒ රැඳී සෙනෙහස අහිමි වේවි දෝ

ගවු ගණනක් ඈත සිටන් මා දිහාම හොරෙන් බලා
හිතේ මැවුණු සොඳුරු සීන ආදරේ තමයි

නිල් අඹරේ හැංගිලා හද සරසන ඔබෙ සිනා //
මාගෙන් වෙන්වී ඈතට පාව යාවිදෝ //

ගව් ගණනක් ඈත සිටන් මා දිහාම හොරෙන් බලා
හිතේ මැවුණු සොඳුරු සීන ආදරේ තමයි

අසන්න ගීතය

පද - චින්තක ජයසිංහ    සංගීතය - රොමේෂ් සුගතපාල



www.studentlanka.com

# දමිත් අසංක - මේ අනන්ත රාත්‍රියේ

මේ අනන්ත රාත්‍රියේ සඳේ නුඹ කොහේ
තාරුකා කියන්නකෝ නිදන්නේ ඈ කොහේ

අඳුරේ ගිලී නොපෙනී ගියේ සුසුමයි ලු මා ඇගේ
යුග නෙත් මගේ කඳුලින් තෙමී තනි වේද මා අනේ

ජීවිතේට මං කියූ තාරකාවියේ //
දැන් ඉතින් නුඹත් ගියා කළුවරයි අනේ

අම්බරේ හි සඳ නොවී එළිය දුන් ළියේ //
දැන් ඉතින් නුඹත් ගියා කළුවරයි අනේ

මේ අනන්ත රාත්‍රියේ .......

[අසන්න ගීතය]



www.studentlanka.com

# දයාරත්න සහ අමරා රණතුංග - මහ රෑ යාමේ

කන්ද උඩින් එන කිකිළිය ගෝමරියේ........

මහ රෑ යාමේ මේ ඇල් හේනේ තනියම සීපද කියනු අසා //
වෙහෙස දරාගෙන පාර අසාගෙන //
ආවෙමි අඳුරේම ඔබව සොයා //

සීපද රාවේ සවනත වැටිලා ඉන් මත් වීලද ඔබ ආවේ //
මහ රෑ තනියම මේ ලෙස එන්නට //
හොඳ නැහැ ඇයි එය නොසිතුයේ //

ඔබ සීපද මට හරි මිහිරී මෝරන සෙනෙහස යයි ඉතිරී //
කියන්න සීපද රස කරලා අහන්න ඒවා සැනසීලා //
ඔබ කියනවනම් අසා සිටින්නම් ඔබේ දෙපා ඔබේ දෙපා මුල සැතපීලා

අඳුරයි සුළඟයි අපව වටා තනි රකිනවා ආදරය සොයා //
දිවි ගංගාවේ ඔරුවයි හබලයි වාගේ නැලවෙමු සුවය පතා //

අසන්න ගීතය

පද - මර්වින් සේනාරත්න සංගීතය - දයාරත්න රණතුංග



www.studentlanka.com

# දයාරත්න රණතුංග - සරසවියේදී හෙට විතරයි

සරසවියේදී හෙට විතරයි හමුවන්නේ
කිමද කුමරි නෙතු කඳුලැලි පුරවන්නේ

දොඹ සූරණ මහා වැස්සේ තනි කුඩයේ
අපි තනි වී දොඩමලු වූ හැටි පෙනියේ
කොමල පපා මුකුළු හිනා පෑ දෙතොලේ
මතකද මහවැලි දැලේ සපු සෙවනේ

කලා ශිල්ප රාජ ඉසුරු මල් යහනේ
එදා ලපලු හෙවනේ සරතැස නිවුණේ
අපේ මියුරු සීන පිරුණු රජ දහනේ
මෙදා සුවඳ පමණි ඉතිරි හන්තානේ

කෝල බැලුම් හෙළා රඟන පරවියනේ
මාල බැඳුනු ගෙල කුමරිගේ හඳ පානේ
හීනෙන් දැකුමට විතරයි උරුම වුනේ
හන්තානේ කුමරියේ නාඩන් ල සඳේ

අසන්න ගීතය

පද - ශ්‍රී සමන් විජේතුංග        සංගීතය - දයාරත්න රණතුංග



www.studentlanka.com

# දීපිකා ප්‍රියදර්ශිනි - මේ තනි යහනේ

මේ තනි යහනේ නිදි නැති පාලු රාත්‍රියේ
මා සිතු දැහැනේ නොනිදන කවුරු හෝ හිඳී
පෙරදා පුරුදු සේ නො හඬා හැඬු නෙතින්
මේ තනි යහනේ නිදි නැති පාලු රාත්‍රියේ

තාරකා දැලෙන් එහා ඒ අහිමි විජිතයේ
සිහින සේ ගලා හැලෙන්නේ සුවඳ ආදරේ
පිදෙනා යොවුන් සිනා මල් සැඟවෙනා පැයේ
සුසුම දෝ හඬා වැටෙන්නේ බිඳුණු ස්නේහයේ

නෑ සිනා හඬින් කියූ ඒ පෙම් කතා අපේ
මේ සඳයි මමයි අසන්නේ තනිව මේ රැයේ
කවුළුවෙන් බලා සිනාසී නිසලවී හදේ
කවුරුදෝ සෙමෙන් මැකී යයි කඳුළකින් නෙතේ

[අසන්න ගීතය](#)

පද - කුමාරදාස සපුතන්ත්‍රි සංගීතය- රෝහණ වීරසිංහ



www.studentlanka.com

# දීපිකා ප්‍රියදර්ශනි - පිතු සෙනෙහේ

පිතු සෙනෙහේ පිදු පියෙකු නොමැති ලොව
දූ දරුවන් හිනැහී ඇතිදෝ
උන්ගේ සිත රැඳී තනිය මකන්නට
මවුනට කවදා හැකි වේදෝ

හිරු මඬලක් වී කිරණ බෙදා දී
නුග සෙවනක් සේ සිසිල සදා දී
ජීවිතයේ බර උරින් දරා
පියවරු මයි ලොව මහ සයුරක් වී පොලොව නිවාලන්නේ

මෙත් මුදිතා ගුණ සිතෙහි දරා
පෙරුම් පුරා ඉඳ සසර පුරා
අම්මාවරු මතු බුදු වන්නේ
පියවරු මයි ලොව බුදුවන මවුනට ඒ විවරණ දෙන්නේ

[අසන්න ගීතය]

පද - කුමාරදාස සපුතන්ත්‍රි සංගීතය- රෝහණ වීරසිංහ



www.studentlanka.com

# එඩ්වර්ඩ් ජයකොඩි - අන්න බලන් සඳ ( කුණ්ඩල කේශී )

අන්න බලන් සඳ රන් තැටියෙන් - සුදු සීත ගඟුල් ගලනා
හද සෝක තැවුල් නිවනා
චන්දන පල්ලව කෝකිල කූජන සංගීතයේ පැටලී
සුන්දර මේ වන ගුල්ම යහන් ගැබ ආදර බස් දොඩනා
හඬ දේවි දෙකන් පිනනා

අත් පසුරෙන් යුතු පෙම්බරයන් බඳ බන්දා සෙනේ සිතිනී
ලිය වැල් පැටලී ගොසිනී
පුෂ්ප පිපී මකරන්ද ගලා එයි මාරුතයේ හැපිලා
මන්මද රංගන මණ්ඩපයේ මෙම මන්ද බලා හිඳිනේ

තව පෙම්බර මා සාමිණේ

අසන්න ගීතය

පද - මහගම සේකර සංගීතය - සෝමදාස ඇල්විටිගල



www.studentlanka.com

# එඩ්වර්ඩ් ජයකොඩි - බුදු බණක් කියන්නට

බුදු බණක් කියන්නට පුතු ගෙදර ඇවිල්ලා
බුදු සුවඳ බුදු එළිය පැල පුරා ඉහිරිලා
බුදු පුතේ නුඹ දිනෙක බුදු වෙයන් කියාලා
නියත විවරණ දෙන්න යමු මැණිකේ නැගිටලා

හැබැයි ඉස්සර වගේ මගෙ පුතේ කියාලා
තුරුළු කරගන්න නම් එපා ඉස්සර වෙලා
බත් කටක් කවන්නට හිත ගියත් ලං වෙලා
එපා සිල් ඇවත් වෙයි මව් සෙනෙහෙ සිහි වෙලා

බණ කතා කියනකොට හුරතලෙන් මුව විදා
කඳුළු පිස දුක නිවෙන බන අසමු නෙතු පියා
හැඬුම් නැති සිතින් පුතු දකින්නට දිරි පතා
අපි විවරණ ලබමු වැටී වැඳ පුතු දෙපා

අසන්න ගීතය

පද - ආනන්ද හේවා රන්හිඳ සංගීතය- රෝහණ වීරසිංහ



www.studentlanka.com

# ගුණදාස කපුගේ - මාරියාවේ

මාරියාවේ ////

මාරියාවේ ඔහෙ නවතින්නේ
සමා වෙලා මේ දුක අහපන්නේ
වියරු විලාසෙන් ඇයි නුඹ එන්නේ
වළාලයට ඉඩ දී පලයන්නේ

(නුඹ ආ දා සිට පැල අඳුරේමයි
සතුට සාම සොම්නස නො රැඳෙන්නේ) //
මේ දුක් දෙන්නට ඇයි නුඹ එන්නේ
වළාලයට ඉඩ දී පලයන්නේ

නුඹ ආ දා සිට නිවුණු ලිපේ ගිනි
හද තුල මෙලවී ඇවිලෙන්නේ
මේ දුක් දෙන්නට ඇයි නුඹ එන්නේ
වළාලයට ඉඩ දී පලයන්නේ

අසන්න ගීතය

පද - රන්බණ්ඩා සෙනෙවිරත්න   සංගීතය - ගුණදාස කපුගේ



www.studentlanka.com

# ගුණදාස කපුගේ - නින්ද නැති රැයේ

නින්ද නැති රැයේ සඳ කඳුළු මීදුමේ
හැංගිලා හඬන්නේ ඇයිද ප්‍රථම ප්‍රේමයේ
තාරුකා දියේ ගිලී නිල් එළිය නිවේ
වැහි බින්දු වැටේවී රෝස පෙති කඩා හැලේ

කිලිපොලා සැලී යමින් නොහිම් සීතලේ
තුරුළු වෙමි දෙනෙත් පියා ඔබගේ උණුසුමේ
ජීවිතය ඉතින් අපේ සිහිනයක් නොවේ
හෙට උදේම අවදි වී යා යුතුව තිබේ

රැය ගෙවේ සඳත් නිවේ දුරයි ජීවිතේ
ඉතින් අවසරයි මගේ පුංචි කුමරියේ
කටු වලට දෙතොල් තියා මලක් නැති ගසේ
සිඹිමි එකම හාදුවයි සොඳුර ඒ මගේ

අසන්න ගීතය

පද - රත්න ශ්‍රී විජේසිංහ සංගීතය - ගුණදාස කපුගේ



www.studentlanka.com

# ගුණදාස කපුගේ - උන්මාද සිතුවම්

උන්මාද සිතුවම් මැවේ බිඳේ
මීදුම් වලා මැද අතීතයේ
බිඳුණු පෙමින් ගිනි ගත් හදවත්
තනිවේවි එක්ටැම් ගේ

අනන්ත සයුරේ බියකරු දිවි දියඹේ
පාලු හුදකලා සුළඟ පමණී උරුමේ
හඬා වැටෙන සිත සදා සරණ මට
තනි වේවි එක්ටැම් ගේ

දහසක් මල් මැද එකම මලයි පැතුවේ
ඒ මල කිම සරදම් කර සැඟව ගියේ
දැනේ තවම මට මලේ සුවඳ පොද
තනිවේවි එක්ටැම් ගේ

අසන්න ගීතය

පද - මහාචාර්ය සුනිල් ආරියරත්න
සංගීතය - සරත් දසනායක



www.studentlanka.com

# <u>හර්ෂණ පෙරේරා - සඳ පෑයුවා එක දවසක්</u>

( එක් ටැම් ගේ ටෙලි නාට්‍ය තේමා ගීතය )

සඳ පෑයුවා එක දවසක් එක්ටැම් ගෙයට උඩින්
ජීවිතය නැවතී එක්ටැම් ගෙයක තනි වී
සඳ පෑයුවා එක දවසක්

සඳ එළිය වැටී කව්ලුවෙන් හදවතම එළිය කරමින් //
සිනා සුනා ඔබ එක මොහොතක්
එබී අඳුරු ජීවිතයෙන්

සඳ පෑයුවා එක දවසක් .....

සඳ වතියේ ඔබ ඇතයි ඔබේ එළිය සිසිලසයි //
මුවා නොවෙන් අඳුරු වලාවට එළිය සඟවා තවත්

අසන්න ගීතය

පද - ඉරේෂ් ලොකුබණ්ඩාර
සංගීතය - ශාන්ත ජයලත් තිසේරා



www.studentlanka.com

# MiLiN - පායා ඇයි හිනැහෙන්නේ

පායා ඇයි හිනැහෙන්නේ නිල් ගුවනේ තරු රහසේ
නැති වී නැති වී නම් අගේ මුහුණේ
නිල්වන් දෙනෙතේ කාන්ති
පායා ඇයි හිනැහෙන්නේ

ඇගෙ  වත මට නොපෙනේ නම්
පුන් සඳ ඇයි නොපෙන්නේ //
නැති දා ඇගේ ගී රාවේ
කොව්ලනි ඇයි  ගී ගැයුවේ

වනයේ පිපි මල් ගොමුවේ
සමනලයනි ඇයි හැඬුවේ
නැතිවී නැතිවී නම් ඇගෙ මුහුනේ
නිල්වන් දෙනෙතේ කාන්ති

ඇගෙ දිමුතු දසන් නොපෙනී
මට මොකටද මුතු පන්ති //
ඇගෙ කඳුලැල් නැති විටදී
ඕනා නෑ දියමන්ති
පායා ඇයි හින්හෙන්නේ........

අසන්න ගීතය Original Hindi Song

පද - ගුණරත්න අබේසේකර



www.studentlanka.com

# ඉන්ද්‍රානි බෝගොඩ - විදුලිය එලිය දැක

විදුලිය එලිය දැක ගිනිහුල දියේ හෙලා
මග වැරදිලා දිව්වේ මං මුලා වෙලා
පැන ගිය මුවන් ළඟ හැලුනයි නෙලූ පලා
දොර ඇරපන් අම්මේ මට සමා වෙලා

කස්තුරි කපුරු ගෑ තරමට එපා වුනි
තිත්තයි අනේ තිත්තයි මී වදේ පැණි
ඇස් රතු කළ කොලොප්පමකට හිනා වුනී
මහ මෙර වගේ නුඹ නොදොඩා බලා වුනී

මෝල් ගහත් ඇවිලුනි කරුම ගින්නට
උණුසම මදි වුනා ඔය පැලේ ඉන්නට
ආ ගිය මාවතත් කිම නෑ පෙනෙන්නට
අම්මේ දොර අරින් නුඹේ පොඩි හිඟන්නිට

අසන්න ගීතය



www.studentlanka.com

# ජානක වික්‍රමසිංහ - පිරිත් පොත සේ පිවිතුරුයි

පිරිත් පොත සේ පිවිතුරුයි බණ කතා මෙන් පින්බරයි
සුන්දරයි කව් සිළුමිණේ කවි වගේ
මං නුඹට පානා ආදරේ

රුවන් වැලි සෑයට උසයි මහා පැරකුම් වැව වගෙයි
ඉසුරුමුණි පෙම් යුවල වත් විඳ නෑ
අපි අපට පානා ආදරේ

තුන් රුවන් සරණින් බෙලෙන්
සිවු වරම් දෙව් අනුහසින්
සෙත් පිරිත් සේ වාසනා වේවා
මං නුඹට පානා ආදරේ නුඹ මටම පාන ආදරේ

පිරිත් පොත සේ පිවිතුරුයි ....

අසන්න ගීතය



www.studentlanka.com

# කරුණාරත්න දිවුල්ගනේ - සමනල වැව පුරවන්නට

සමනල වැව පුරවන්නට බෙලිහුල් ඔය ගලා ඇවිත්
ආදර කඳු තරණය කර දෙහදක් අද වෙන්ව ගිහින්
සුවඳ හඳේ රඳවලා යන්න ගිහිල්ලා //

පහන් තරුව පායා විත් ඔබ එන බව පවසන විට //
සරසවියේ රෑනින් ඔබ ඉගිල ගිහිල්ලා
සුවඳ හඳේ රඳවලා යන්න ගිහිල්ලා //

පෙර දින අප හමුවූ තැන නටබුන් පමණකි කඳුලක //
කඳු අතරේ වලා රොදක ඔබ සැඟවීලා
සුවඳ හඳේ රඳවලා යන්න ගිහිල්ලා //

[අසන්න ගීතය]()



www.studentlanka.com

# කරුණාරත්න දිවුල්ගනේ - හිටියා එදා නම්

(හිටියා එදා නම් //
මගෙ ළඟ තනියට
නුඹ නෑ අද මම විතරයි තනියම) //

මගෙ හිසට සෙවනැල්ල නුඹේ අත
වෙන්නම් කීවා මතකද නුඹ මට
මා හැර නුඹ ගිය හින්දා ඈතට
මගෙ හිසට සෙවනැල්ල මගේ අත

හිටියා එදා නම්........

නුඹගේ මුනට පරාද පුර හඳ
දුටු තැන මට හරි හිරිහැර කරදර
මා හැර යන දා නුඹ පසුපස ගිය
මගේ හිත ආවේ නැහැ තව ඔතැනද

හිටියා එදා නම්......

අසන්න ගීතය



www.studentlanka.com

# කරුණාරත්න දිවුල්ගනේ - පෙම් කවක් ලියූ

පෙම් කවක් ලියූ නුඹ සිත් අහසේ
එය මකා දමා ගිය හැටි රහසේ
නුඹ මෙතෙක් රැඳී උන් මා මනසේ
පෙම් පුර වතක් නිමා කරන්නද මා කෙලෙසේ

නුඹ යන්නම යන්නම් යනවා නම්
මට ඉන්න කියන්නට බැහැනේ ඉතින්
යළි එන්නම එන්නම හිතුනේ නම්
නුඹ එන්න එපා මගේ හිත තහනම්

හුරතලෙන් ඇවටිලා මගේ ළඟින්
දුන් සතුට එපමණද මට පවසන්
සඳ එළිය පොලොවටයි හිමු වූයේ
සඳ අහසේ රැඳුනාද රත්තරනේ

[අසන්න ගීතය]()



www.studentlanka.com

# කරුණාරත්න දිවුල්ගනේ - විදිමි දඬුවම්

විදිමි දඬුවම් ....කඩා බිඳ දැමූ වරදකට ගිවිසුම්
ප්‍රේමයේ ගිවිසුම්....මෙනෙහි කරමින් යට ගියාවේ
සොඳුරු සැමරුම්..... විදිමි දඬුවම්....

ගලා ගිය ගග දිය සිහිල ලැබ ..සිතක දාහය නිවාලයි....
සිදී ගිය ගග ළවැලි ගිනි ගෙන ...සිතක සෙනෙහස දවාලයි
දුරුම අතීතය සිහිනයක් වී ... සිතක සෙනෙහස දවාලයි

පලා ගිය ගෙවිලිය ගැයූ ගී ..තාම ඉහ ඉද්දර ඇසෙයි
අනේ යන තුරු නොවේ සැනහී ...ඉන්නවානම් හිත නිවෙයි
කළුවර රැයේ සුබ සිහිනයක් වී .... ඉන්නවා නම් හිත නිවෙයි

විදිමි දඬුවම් ....

[අසන්න ගීතය]



www.studentlanka.com

# කරුණාරත්න දිවුල්ගනේ - සුදු බංඩි

මිනින්දෝරු කන්තෝරුවේ මුලාදෑනි ටික
සුදු බංඩි මගේ නිදා ඉන්න ඉඩම මනිනවද

ඈ ඇහැ ඇරේවි යන්න හොඳයි දම්වැල් අරගෙන
තරහ අවසරයි යනවද දම්වැල් අරගෙන

පින් කුඹුරු නෙළන කාලෙට මට හීල අරන් එන
හිස විසාදියට තෙල් උලලා තොන්තුවා වෙන
රත්තරන් දෑත සුදු බංඩිගේ දෙනියේ පස් යට
රත්තරන් දෑත සුදු බංඩිගේ දෙනියේ පස් යට

මිනින්දෝරු කන්තෝරුවේ...................

දෙයි හාමුදුරෝවෝ දන්නවනම් දැන් ඈ නැති වග
තෙල් පහන  වුනත් නිවා දමයි සංහිඳ පාමුල
වාවන්නේ නැහැ මේ දුරුත්ත සංසාරේ තනි මට
වාවන්නේ නැහැ මේ දුරුත්ත සංසාරේ තනි මට

[අසන්න ගීතය]



www.studentlanka.com

# කසුන් කල්හාර - ඉන්ද්‍රචාපා ලියනගේ ආදර මල් වල

ආදර මල් වල පාට කියන්නද ඒ වගේ ලස්සන තව නෑ //
මීදුම් පිනි පොද දෑස වසන් කර සමනල් සිහිනය පිපුනා
සමනල් සිහිනය පිපුනා

දේදුනු රේඛා  දෑස ම තවරා තවමත් මල් සිත බලා සිටිනවා //
මීදුම් තවරා සුළඟට ඇතක සඟවා තුන් සිත
දෑස හොරෙන් ඇත සොයනවා
අඳුර මැදින් එන්න සඳලියේ

දේදුනු සායම දෑසම බොඳ කර
මාලති යායක හැලිලා මාලති  යායක හැලිලා
සීතල හිම කඳු යහන මියෙන් නැත
දෙව්ලිය සිහිනෙට වැඩියා

සංගීතය - කසුන් කල්හාර

අසන්න ගීතය



www.studentlanka.com

# කසුන් කල්හාර - මීදුම් දුමාරයේ

මීදුම් දුමාරයේ සීත හැන්දෑ යාමේ
සිහින ඇන්ද සා නු වේ
ආශා නැතිද මාත් එක්ක තනිව ඉන්න
කොළ පාට හැලුණු ඇත නිම්නයේ //

නිශා.. නින්ද ඇහැරවා මල් බිඟුන්ටත් හොරා
ආශා.. නැතිද මාත් එක්ක තනිව ඉන්න
කොළ පාට හැලුණු ඇත නිම්නයේ

වලාවකින් හැඩ දමා කුඩාරමක් එහි තනා
ආශා නැතිද මාත් එක්ක තනිව ඉන්න
කොළ පාට හැලුණු ඇත නිම්නයේ

අසන්න ගීතය

සංගීතය - කසුන් කල්හාර



www.studentlanka.com

# කසුන් කල්හාර - සඳ සඳ වගේ

සඳ සඳ වගේ තරු තරු වගේ
මල් මල් වගෙයි අපි අපි වගෙයි
සඳ සඳ වගේ තරු තරු වගේ
මල් මල් වගෙයි අපි අපි වගෙයි

ඔබ මා නොවන තුරු
මම ඔබ නොවන තුරු
ඔබ ඔබම දැයි ඔබ ඔබම දැයි
මම මම ම දැයි

සඳ සඳ වගේ තරු තරු වගේ
මල් මල් වගෙයි අපි අපි වගෙයි

අසන්න ගීතය

පද - විදර්ශන කන්නන්ගර සංගීතය - කසුන් කල්හාර



www.studentlanka.com

# කිංස්ලි පීරිස් - මේ දෑස දුක් විඳී

(මේ දෑස  දුක් විඳී  හැමදාම ඉකි බිඳී  උහුලන්න බෑ මේ හැටී
අපි හැම රැක  ගුලි වේවී
මැවුන බොඳ වේවී
යනවාද කඳුලින් පෙඟී )  //

උරතලය වැලපුනේ ඔබ නැතිව ලතැවුනේ
ඔබෙ  සුවඳ තාමත් ලයේ
මා වෙතම පෑ සෙනේ අන් හිතක ඉපැදුණේ
ඒ කොහොම පවසන් ප්‍රියේ
මේ කඳුළු ගංගා නෙත් කවුළු රිංගා  හද පතුලෙමයි හැංගුනේ
ඔය ඇස්  දෙකම ඉඹලා කිච්චාම දිවුරා  මා හිතුවේ මගේමයි සඳේ

මේ දෑස  දුක් විඳී .......................

මිරිඟුවට රැවටිලා ඔය හීන මත්වෙලා අන් සතුය ඔය මල ලඳේ
හිත මාගේ පාරලා ඔහු තුරුලේ බෝ වෙලා
අමතකද මා ළඟ සෙනේ
මේ කඳුළු ගංගා නෙත් කවුළු රිංගා  හද පතුලෙමයි හැංගුනේ
ඔය ඇස්  දෙකම ඉඹලා කිච්චාම දිවුරා  මා හිතුවේ මගේමයි සඳේ

අසන්න ගීතය

සංගීතය - අමිල දිල්හාන්



www.studentlanka.com

# කිත්සිරි ජයසේකෙර - හැර දමා යන මේ නිමේෂය

(ඕලු 1 - ටෙලි නාටකයෙන් )

හැර දමා යන මේ නිමේෂය කල්පයක් වාගේ
පුංචි හිරි මල් සිත් පුරා පිරි මල් සුවඳ සිහිනේ
කැකුළු පැළයක් අතු දරා හෙට මහ රුකක් මේ මැයි
කැකුළු හිතකට එළිය දුන් හිරු ළඟ නොවේ ඇතයි

හසල අයදින පුංචි මොළකැටි නැගණිවරු අතරේ
විල් දියක් සේ සිටිය කාලේ සිහිව එයි මනසේ
තරු ටිකක් වත් නොපිපි අහසට එළිය දුන් දවසේ
පින් බරින් ආ සොයුරු ස්නේහය දැනුනි මහ මේර සේ

හැර දමා ආ හැකිද ඒ ලොව සිතින් හෙට දවසේ
ගව් ගෙවා ආ දකිනු හැකි නම් එයයි පින දැසේ
හැර දමා යන මේ නිමේෂය කල්පයක් වාගේ
පුංචි හිරි මල් සිත් පුරා පිරි මල් සුවඳ සිහිනේ

අසන්න ගීතය



www.studentlanka.com

# කිත්සිරි ජයසේකෙර - සඳ කැරලි ගල ගලා

( නටු නැති මල් - ටෙලි නාටකයෙන් )

සඳ කැරලි ගල ගලා චිත් මුදු මුහුණ සිප ගනී
මනමාලියේ මා සාවියේ - සිප ගන්න මට දුකයි
සිප ගන්න මට දුකයි - මනමාලියේ මා සාවියේ

මගේ කිලිටි කම නොදැන පතිනියනි මෙහි නිදන
රතු මලින් හෙට උදේ නුඹේ දෑත සරසන්න
නැසියෝ මග බලා සිටිනවා සාවියේ
සිප ගන්න මට දුකයි සිපගන්න මට දුකයි
මනමාලියේ මා සාවියේ

හඳ එලිය නුඹ සිඹී නුඹට රතු මල් කැපයි
හෙට උදේ නැසියන් නුඹේ දෑත සරසාවී
රතු මලින් රතු මලින්
මට නයට දෙනවාද නුඹේ දෑත සරසනා
රතු මලින් එක මලක්
සොඳුරියේ නැසියන් වෙත යන්න

සඳ එලිය නුඹ සිඹී
සිප ගන්න මට දුකයි සිපගන්න මට දුකයි
මනමාලියේ මා සාවියේ

[අසන්න ගීතය](#).



www.studentlanka.com

# ක්‍රිෂාන්ත එරන්දක - මාලිනි බුලත්සිංහල

## මගෙ ආදර පවසට

මගෙ ආදර පවසට ඔබ නියං කලට හඬන අහස
*මගෙ ආදර වරුසාවට ඔබ යටි කුරු කල කළසකි ඔබ*
මගෙ ආදර සිලිලාරට නෙලුම් පතකි ළඳුනේ ඔබ //
*ආදර උල්පත වියලන ගිම්හානේ සැඩ හිරු ඔබ*

මගෙ ආදර පවසට ඔබ නියං කලට හඬන අහස
*මගෙ ආදර වරුසාවට ඔබ යටි කුරු කළ කළසකි ඔබ*
ගිම්හානය වෙනුවට මම වස්සානය වී එන්නද //
*ඒ වැස්සෙන් පෙම්වත් වූ මිහිලිය වී මම ඉන්නද*

මගෙ ආදර සිලිලාරට නෙලුම් පතකි ළඳුනේ ඔබ
*ආදර උල්පත වියලන ගිම්හානේ සැඩ හිරු ඔබ*

අසන්න ගීතය



www.studentlanka.com

# ක්‍රිෂාන්ත එරන්දක  මංජුලා නිමන්ති

## ලියූ කවි පද

ලියූ කවි පද දහක්  අතරේ ලියා ගන්නට බැරිව ලතැවුන
එකම එක දිග පුංචි කවියක් තවම ලියනවා මං තවම ලියනවා මං

*නුඹේ සුවඳ රැඳී පපුව ගැඹරේ කියා ගන්නට බැරිව සිරවුන*
*එකම එක දිග පුංචි පැතුමක් තවම පතනව  මං තවම පතනව  මං*

*උණුසුමක් රැඳී පළල්  උරයක වෙලී  සැතපී නිදන යුගයක*
*නුඹේ සුසුමක් සමග මියැදී යන්න තිබුනා නම්*
*මගෙ  දෙනෙත් පෙති තෙමා රිදවන කඳුළු නැහැ එහෙනම්*

සඳවතක රැඳී සඳලු තලයක තරු කැටක්  වී වැටුණු දවසක
ළ තෙත් සෙනෙහස නුඹේ සිත ළඟ රැඳී නොතිබුණි  නම්
මගෙ දරද නොපිරුණු හිත යට කඳුළු නැහැ එහෙනම්

ලියූ කවි පද දහක් ......

අසන්න ගීතය



www.studentlanka.com

# කුෂානි සඳරේඛා - කුරුල්ලෝ නුඹේ තාලෙන්

( කුරුල්ලෝ නුඹේ තාලෙන් පියාඹන්න ආසයි
පියාපත් කොහේ කොතනින් කොහෙන්දෝ ගෙනෙන්නේ ) //
කියාපන් කුරුල්ලෝ

නෙලුම් මල් නෙළාලා ගෙලේ මල් පලන්දා
කින්නරාවි රූපෙන් බලන් ඉන්නවා දැන්
හීන් බන්ධි ගොයමේ කිරා නිල් රටාවේ

කුරුල්ලෝ නුඹේ තාලෙන් ....

ඉහල ගං දිහාවේ ඇඹුල් පේර මාදන්
ගොපලු බරවෙලා දැන් බලන් ඉන්නවාලු
සින්දු ගීත වන්නම් ඔහේ කියා කියා යමි
කුරුල්ලෝ නුඹේ තාලෙන් ....

[අසන්න ගීතය]



www.studentlanka.com

# ලහිරු පෙරේරා - ලබැඳියේ

ඔබ එන්න සුළඟේ දැවටිලා
මා ඉන්නේ ඔබ දැන් එයි කියා
සුදු හංස තටුවේ සැතපිලා
පෙම් කරමු රහසේ සැඟවිලා

ලබැඳියේ ලබැඳියේ මා සිතුම් සිර කළා
ලබැඳියේ ලබැඳියේ මා සිතින් පෙම් කළා

නා දල්ල වාගේ දිදුලනා
මුදු හාදු වැස්සෙන් මා තේමා
ඔය දෙතොල් අතරේ සිරවෙලා
මට ඉන්න ඇත්නම් තනිවෙලා

ලබැඳියේ ලබැඳියේ මා සිතුම් සිර කළා
ලබැඳියේ ලබැඳියේ මා සිතින් පෙම් කළා

කිරි කවඩි මාලේ මා ගොතා
ඔය ගෙලේ පළඳා හැඩ බලා
මා වින්ද සතුටේ තැන් සොයා
ඔබ යන්න සුළඟේ අප දමා

අසන්න ගීතය

පද - මනුරංග විජේසේකර     සංගීතය - ලහිරු පෙරේරා



www.studentlanka.com

# මිල්ටන් පෙරේරා - සුපුන් සඳක් නැගීලා

සුපුන් සඳක් නැගීලා කිරි බැබලෙන පාරුවේ
රිදී ගඟක් ගලාලා  පලිඟු පුලින තලාවේ

ආදර දියඹ යටයි මිණි මුතු දිලෙනේ
සුව දෙන කැදැල්ලටයි අත් තටු සලන්නේ

සුපුන් සඳක් නැගීලා ...............

නලවන තුරුල්ලටයි රළ පෙළ ඇදෙන්නේ
ගී රස තාලයටයි පෙම් රළ රඟන්නේ

[අසන්න ගීතය]

පද - නිහාල් ඒ ජයසිංහ
සංගීතය - ෂෙල්ටන් ප්‍රේමරත්න



www.studentlanka.com

# විශාරද නන්දා මාලිනි ( මේකලා ගමගේ )

# අහස සේ ඔබ අනන්තයි

( අන්ධ පුද්ගලයකු දකින අනන්ත වූ අඳුර ගැන ලියවුනු ගීයක් )

අහස සේ ඔබ අනන්තයි
සයුර සේ ඔබ අනන්තයි
මේ විශ්වයේ මා දකින්නේ
ඔබ ම පමණයි ඔබ අනන්තයි අනන්තයි

වෙණ තතත් හැඬවෙන තැනත් ඔබ
මධු විතක් උතුරන තැනත් ඔබ
තෙළිතුඩක් දැවටෙන තැනත් ඔබ
පන්හිඳක් ගැවසෙන තැනත් ඔබ

අඩ සඳක් සැඟවෙන තැනත් ඔබ
රළ පෙළක් පෙරලෙන තැනත් ඔබ
සිසිලසක් දනවන තැනත් ඔබ
උණුසුමක් ගෙනදෙන තැනත් ඔබ

අසන්න ගීතය

පද - මහාචාර්ය සුනිල් ආරියරත්න සංගීතය - රෝහණ වීරසිංහ

දැස නොපෙනෙන කෙනෙකු දකිනා අනන්ත වූ අඳුර ගැන ලියැවුණු මේ ගීතයේ මුල්ම ගායනය විශාරද නන්දා මාලිනි ගෙනි. දැස නොපෙනෙන මේකලා ගමගේ මෙම ගීතය ගයා මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ට සහ විශාරද රෝහණවීරසිංහ ශිල්පීන් ගේ නිර්මාණය සංවේදී සිත් වඩා සසල කරන්නට සමත් වී ඇත.



www.studentlanka.com

# විශාරද නන්දා මාලිනි - බුදු කරුණා දැස තෙමී

බුදු කරුණා දැස තෙමී මෙත් සිහිලැල් අද හැලුනා
නිවා තාප ලෝ කතරේ අමා වතුර ගලා බසී
බුදු කරුණා දැස තෙමී

කඳු වැටිවල නිසොල්මනේ ගහ කොල මල් පිපී නටයි //
නැවුම් පොළොව නව නිල්ලේ බුදු සිරිපා පහස ලබයි

කෙලෙස් මලින් උකටලි සිත නිවා තවන සුවය සොයයි
නිසල ඔබේ බුදු රුව ළඟ මගේ හද භාවනා කරයි
බුදු කරුණා දැස තෙමී

[අසන්න ගීතය]

පද - අනුරාධ සෙනෙවිරත්න

සංගීතය - විශාරද නන්දා මාලිනි



www.studentlanka.com

# විශාරද නන්දා මාලිනි - කඩමණ්ඩියේ

කඩමණ්ඩියේ දොළ අයිනේ නුඹව පෙනී
නැවතී බලනවා මොහොතක් කොහොම හරි
කතා නැතුව හිටියත් ගොළු වෙලා අපි
දාහක් දේ තිබේ කීමට බැරුව වැසී

ගහකොළ වලට දාහක් ඇස් නැති හින්දා
සුළඟට සියුම් දාහක් කන් නැති හින්දා
කවදාවත් ම නුඹ මට නොලැබෙන හින්දා
මුනිවත හොඳයි දෙබසින් දුක  වැඩි හින්දා

සයුර මොටද දිය දෝතක් බොන්න බැරී
ඔරුව මොටද වතුරේ පැද යන්න බැරී
දෑස මොටද සිතු සේ දැක ගන්න බැරී
කුසුම මොටද ලං වී රොන් ගන්න බැරී

[අසන්න ගීතය]

පද - සුනිල් ආරියරත්න        සංගීතය - එච් එම ජයවර්ධන



www.studentlanka.com

# නන්දා මාලිනි - කුරුටු ගෑ ගී පොතේ

කුරුටු ගෑ ගී පොතේ  කුරුටු ගී කෑ ගසා
ගිලන් හද පාරවා  ගෙනේ වද වේදනා
කුරුටු ගෑ ගී පොතේ

ඔබෙන් පෙර දා උගෙන කවි කම්
ලියූ කවි ගීතිකා
ඔබේ නාමෙන් හැඬූ කඳුලෙන්
ගයමි මම කිවිඳුනේ

කුරුටු ගෑ ගී පොතේ......

මියුරු කවි වැල් කුරිරු ස්වරයෙන්
ඇසේ රෑ යාමයේ
නොලැබ  කිවිඳුන්  කුමට කවි කම්
කිවිඳ මට කවි ලොවේ

කුරුටු ගෑ ගී පොතේ......

[අසන්න ගීතය]

පද -  සුනිල් ආරියරත්න        සංගීතය - ස්ටැන්ලි පිරිස්



www.studentlanka.com

# විශාරද නන්දා මාලිනි - මගේ සඳ ඔබ

මගේ සඳ ඔබ මගේ සඳ ඔබ
එදා සඳ නොව මෙදා සඳ ඔබ මගේ
මගේ සඳ ඔබ මගේ

එදා මට ඔබ සරා සඳ විය
කවි ඇසින් දුටු සොඳුරු පියකරු
අඳුරු හද ගැබ එකලු කරමින්
උදා විය ගිරි ශිකර සිරසේ

මගේ සඳ ඔබ ...........

මෙදා මට ඔබ සැබෑ සඳමය
විදු ඇසින් දුටු ලොවය විසකුරු
ප්‍රානයෙන් තොර වියලි සඳ සේ
ඔබද අද මා අසල ගැවසේ

අසන්න ගීතය

පද - මහාචාර්ය සුනිල් ආරියරත්න    සංගීතය - රෝහණ වීරසිංහ



www.studentlanka.com

# නන්දා මාලිනි - ශාන්ත මේ රාත්‍රියේ

ශාන්ත මේ රාත්‍රියේ ශාන්ත මේ රාත්‍රියේ
චන්ද්‍රා කාන්ති දේ ආලෝකේ
ආයේ ආයේ නෙත ප්‍රබෝධ වේ

ඉපිල ආවේ ප්‍රීතිය මෝරා යව්වන ප්‍රේමේ සදා
හා කුමුදිනි නැන්ඟ තරංග සිනා
පවන සමග නැලවී නැලවී

නින්දේ සිටිය ඔලු මලේ
සයනීත පිබිද ආ
හා බඹරෝ ඇයි බඹරෝ රාත්‍රී ආයේ

අසන්න ගීතය

පද - ඩී ටී ප්‍රනාන්දු                    සංගීතය - මොහොමඩ් ගවුස්



www.studentlanka.com

# විශාරද නන්දා මාලිනි - සුදු හාමිනේ

සුදු හාමිනේ නුඹ කොතැනද අද දවසේ
දීගෙක ගිහින් දරු පිරිවර මැද සුවසේ
ලේලිය කටුව මගෙ පුතු වෙන්විය රහසේ
මං විතරයි තනියම දැන් මගෙ නිවසේ

නුඹලගේ තාත්තා ඇත දුර බලාගෙන
කවදා දූ පුතුන් ඒ දැයි පතාගෙන
වේවැල් කැඩුණු පුටුවේ වක ගසාගෙන
මං ඉන්නවා නෙතු කඳුළැලි දරාගෙන

සුදු හාමිනේ .....................

දරුවන් ඇඳුම් ඇඟලුම් ගෙන සිම්බින්නෙමි
මනසින් එදා කෙළි සෙල්ලම් දකින්නෙමි
මරණයෙ දොරකඩට සපැමිණ සිටින්නෙමි
ලේ කිරි පෙවූ දරුවන් දැක මියෙනෙමි

අසන්න ගීතය

පද - මහාචාර්ය සුනිල් ආරියරත්න   සංගීතය - නන්දා මාලිනි



www.studentlanka.com

# නාරද දිසාසේකර - ආදර නිල් දෑසේ

ආදර නිල් දෑසේ ආදර නිල් දෑසේ
මැණික් රුවක් රැඳී තිබේ ආදර නිල දෑසේ

ආදර මල පිපි වැනේ ඇගේ පෙම් හද පොකුණේ
මගේ ළමැද පළදින්නයි ඒ රන් මල පිපුනේ

විමානයේ කවුළු දොරින් නෙත් හී සැර විදලා
කුමාරියක් කතා කරයි කාටද අත වනලා

සිනහ දෙතොල් යහනාවේ වැතිරෙමි රස උරලා
හද ළෙන් දොර වසනු මැනවි මා එහි සිර කරලා

අසන්න ගීතය

පද - ධර්මසිරි ගමගේ සංගීතය - ආචාර්ය ප්‍රේමසිරි කේමදාස



www.studentlanka.com

# නාරද දිසාසේකර නන්දා මාලිනි
# ගලන ගඟකි ජීවිතේ

ගලන ගඟකි ජීවිතේ
දයාලු ලෝකයේ
මිහිර පතා ආදරේ
ලපලු නටයි ගං තෙරේ

වැලි තල කිති කවන නටන
පෙම් රළ වැළ ඉවුරු බඳින
මිහි තලයක සුවය දැනෙන
උකුළ තලය වන් නැලවෙන

පෙමට පෙම පුදා
තුඩට තුඩු දිදී
කුරුළු ගී ගයයි
ආදරේ බැඳීලා

අසන්න ගීතය

පද - ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ
සංගීතය - විශාරද අමරදේව



www.studentlanka.com

# නරි බෑනා - කුමටද සොබනියෙ

කුමටද සොබනියෙ කඳුළු සලන්නේ - හේතුව මම නොදනිම්
ගිරි හෙල් අරඹේ ඇති මගෙ නිවසට මම ඔබ ගෙන යන්නම්
ඔබ හට හැම සැප එහි දෙන්නම් //

සඳ පායන කල ගඟබඩ ඉඳගෙන ඔබ හිස පිරන්නම්
මල් පෙති විසුරුණු සුදු වැලි මතු පිට ඔබ ගෙන අවිදින්නම්
සොඳුරියේ ආදර බස් දෙන්නම් සොඳුරියේ ආදර බස් දෙන්නම්

සඳ පායන කල ගඟබඩ ඉඳගෙන ඔබ හිස පිරන්නම්
මල් පෙති විසුරුණු සුදු වැලි මතු පිට ඔබ ගෙන අවිදින්නම්
සොඳුරියේ ආදර බස් දෙන්නම් සොඳුරියේ ආදර බස් දෙන්නම්

තුණු අග දිලිසෙන පිණිකැට අරගෙන ඔබේ ඇඟ දොවන්නම්
ඉර පායන විට පිබිදෙන මල් ගෙන ඔබෙ හිස සරසන්නම්
කොමලියේ ආදර බස් දෙන්නම් - කුමරියේ ආදර බස් දෙන්නම්

අසන්න ගීතය

පද - දයානන්ද ගුණවර්ධන        සංගීතය - ලයනල් අල්ගම



www.studentlanka.com

# නෙලු අධිකාරි - සිනහවකට වඩා ඔබේ

සිනාවකට වඩා ඔබේ කඳුළු වලට මං ආසයි
මා වෙනුවෙන් නැගෙන කඳුළු නම් //
කඳුළුවලට වඩා ඔබේ සිනාවකට මං ආසයි
මා වටකර නැගෙන සිනා නම් //

සඳ එළියට වඩා සඳේ සඳ අඳුරට මං ආසයි
සඳ අඳුරේ ඔබ හමු වේ නම්
සඳ අඳුරට වඩා සඳේ සඳ එළියට මං ආසයි
සඳ එළියේ ඔබ හමුවේ නම්

මහ මන්දිරයකට වඩා ඔබේ පැලට මං ආසයි
එය තැනුවේ මා වෙනුවෙන් නම්
ජීවිතයම දුකක් වුනත් ජීවිතට මං ආසයි
ඔබ ඉන්නේ මා වෙනුවෙන් නම්

අසන්න ගීතය



www.studentlanka.com

# නිරෝෂා විරාජිනී - සුදු ඇත් පොව්වෙක්

සුදු ඇත් පොව්වෙක් සුදු නෙළුම හොඬින් ගෙන
පැදකුනු නොකලත් සිරි යහනේ
පෙරුම් පුරා මා කුසට පැමිණි බිලිඳු
මට රජ පැටියෙක්

හංකිති කවමින් කුස තුල සක්මන් කරනා
නුඹ දඟයෙකු වේදැයි නිකමට මෙන් මට සිතෙනා
පැටියෝ නුඹ දුවක වුනත් මට පුතෙකු වුනත්
නුඹේ හිස පළඳන්නේ වෙනසක් නැති එක ආදරයයි

කුස තුල දරුවයි මතු බුදු වන පැතුමන් නෑ
ලේ කිරි කර පෙව්වයි උදම් අනන්නට රිසි නෑ
පැටියෝ නුඹ දුවක වුනත් මට පුතෙකු වුනත්
මා නුඹට පුදන්නේ සැබෑව දිදුලන ජීවිතයයි
ජීවිතයයි ....... ජීවිතයයි

අසන්න ගීතය



www.studentlanka.com

# ප්‍රින්ස් උදය ප්‍රියන්ත - සීගිරියේ කුරුටු ගීත

-

සීගිරියේ කුරුටු ගීත  ලස්සනයි
ඒ ලස්සන ගී ලියන්න බැහැ මට දුකයි
මුළු කොලේ පුරා ලීවේ එක පේළියයි
මුළු හදවතින් ම මම ඔබ හට ආදරෙයි

අටවක සඳ පොඩි වුනාට හරි හැඩයි
පුර හඳටත් වැඩියෙන් අව්හිංසකයි
ඒ තරම්ම මගෙ සෙනෙහස සුන්දරයි
මට කියා දෙන්න බැහැ මම හරි අසරණයි

හීන වලට හුරු කෙරුවේ ඔබ තමයි
හීන වලින් අයින් වෙන්න මට බයයි
ඒ හීනෙට  මම තවමත් ආදරෙයි
අහිමි වෙන්න එපා ඔබට පව් පිරෙයි

[අසන්න ගීතය]



www.studentlanka.com

# රොඩ්නි වර්ණකුල - යස ඉසුරු ( රතු හැට්ට කාරී )

යස යස ඉසුරු පිරුණු තැනා - සිරි දෙව් දු සිටින තැනා //
ළඟම ඇතේ දුරක නැතේ - අපි යන්නේ ඒ පාරේ
යස ඉසුරු පිරුණු තැනා - සිරි දෙව් දු සිටින තැනා //

යුක්ති ගරුක අතීතයට කැන්දන් යමි මම
දස රාජ ධර්ම කළ - තෙද වීර රජුන් ඇත
ඇස් ඉදිරියේ ඔබ ළඟ //

අතීතයේ ඉස්ටෝරුවේ - එදා ඉඳන් මම
නිදි මර මර මුර කොට - බහිරව බිලි පුද කොට
රැක ගත්තේ නුඹලට //

යස ඉසුරු පිරුණු තැනා ..........
රජවරු රජ මැතිවරු - යස රාජ බිසෝවරු
කළ කෙලි සෙල්ලම් දැක - තව කාසි දියන් මට //

හොඳ තෑගි දියන් මට //
යස ඉසුරු පිරුණු තැනා ..........

අසන්න ගීතය



www.studentlanka.com

# රොනල්ඩ් ෆ්‍රැන්සිස් - ඔබ මට ඇතයි

ඔබ මට ඇතයි දුර ඇති අහසයි
නිල් ගගනත සේම සුදු සේල ගවටන්න ආසයි
ඔබ මට ඇතයි දුර ඇති අහසයි
නිල් ගගනත සේම සුදු සේල ගවටන්න ආසයි
ඔබ මට ඇතයි

මොර සූරන වැස්ස මගෙ පියස නාවනවා සීතයි
ඒ මොර වැස්ස නොදැනෙන්නේ ඔබ ඉන්න දාටයි

ඔබ මට ඇතයි දුර ඇති අහසයි.......

සැලිපිළි අන්ද ඔබ කැන්දගෙන එන්න ආසයි
පොල් අතු ගෙපැල රජ මැදුර කරවන්නේ කවදැයි
සැලිපිළි අන්ද ඔබ කැන්දගෙන එන්න ආසයි
පොල් අතු ගෙපැල රජ මැදුර කරවන්නේ කවදැයි

ඔබ මට ඇතයි දුර ඇති අහසයි.......

අසන්න ගීතය



www.studentlanka.com

# රොහාන් ශාන්ත බුලේගොඩ - සඳක් නම්

සඳක් නම් බැස යන්න තිබුනා
හඬන අහසට අඳුර දී
මලක් නම් ගිලිහෙන්න තිබුනා
කටු අගට ලස්සන නොදී

පරෙවි තුඩකින් විළඳ දුන්නට
ගිරවියක වළඳන්නේ නැහැ
කඳුළු බිඳුවක රැඳෙන ගින්දර
හිනාවක් හඳුනන්නේ නැහැ

පොළොව උසුලන සියළු දුක් සැප
අහස් තලයෙනි හිමි වුනේ
පොළෝ තලයට අහස දුර බව
සිතන්නේ ඇයි මිනිසුනේ

සංගීතය - එච්. එම්. ජයවර්ධන පද - දයා ද අල්විස්

අසන්න ගීතය



www.studentlanka.com

# රෝහණ සිරිවර්ධන - දේව මන්දිරේ

දේව මන්දිරේ
වැතිරී බැතියෙන් පුදසුන අභියස
ආයාචනා කරමි දැවෙන සිතේ
සංකා සෝ දුක් නිවන ලෙසේ

අපටම වෙන්වූ  අපගේ ලෝකය
යදම් පවුරු දා දොරගුළු ලා  ඇත
දෙතැනක තනිවුනු දෙසිතක සෙනෙහස
කවදා හමුවේදෝ

සෙනෙහස බිඳ දා ඉවත බලු සඳ
ඈ තනි වෙනවා රුදුරු ලොවේ අද
පහන් හැඟුම් මැද අප හමුවන දින
කවදා ලංවේ දෝ

අසන්න ගීතය

පද - කැමිලස් පෙරේරා   සංගීතය - එච්. එම්. ජයවර්ධන



www.studentlanka.com

# රූකාන්ත ගුණතිලක - උකුලට නාවත් එදා වගේ

උකුලට නාවත් එදා වගේ මා ඔබෙ පුතු අම්මේ
යොදුනක් ඇතින් උන්නත් මා මා ඔබ ළඟ අම්මේ

කටු කොහොලින් පිරි මට හිමි ලෝකේ
ඔබ සරණයි අම්මේ
රෑ දහවල මට සෙවනක් වේ
සුවඳ ඔබෙ අම්මේ

අත පය දැඩි වී වැඩිහිටි වුවා
ඔබ සෙවනේ අම්මේ
කුරා කුහුඹුවෙකි දිය රැස් දහරේ
මතු මතු දා අම්මේ මා ඔබ ළඟ අම්මේ

[අසන්න ගීතය]

සංගීතය - රූකාන්ත ගුණතිලක    පද - අජන්තා රණසිංහ



www.studentlanka.com

# සනත් නන්දසිරි - බෝ මළුවේ මල්

බෝ මළුවේ මල් සුවදට පැටලී
අම්මා පෙව් කිරි සුවඳ ගලා එන්නේ
සුපුරුදු උණුසුමකට සිත ඇදී
ගේ දොර සෙල්ලම් පිටිය මතක් වෙන්නේ
දං බෝවිටියා කැලේ මැදින් ඉන්න හිතයි නුඹ ළඟට සැනින්

එතෙර කරන්නම් සතර වරිගයම සංසාරේ යන මේ ගමනේ
චුට්ටක් සෙල්ලම් කරලා එන්නද පුරුදු යහළුවන් හා සැනිනේ
එහෙම ගියත් ඒ අය පොඩි සාදු කියා කියනවිට වැඳ වැටිලා
කොහොමද අම්මේ ඔට්ටු දුවන්නේ වෙල් ඉපනැල්ලේ පැන නටලා

භවයෙන් භවයේ පෙරුම් පුරා මම බවුන් වඩා උපදින වාරේ
දිනයක මතු දා හතර වරිගයම එතෙර කරන්නම් සංසාරේ
ඉන්පසු ඇවිදින් අම්මේ ඔබ ළඟ ඉන්නම් කිරි සුවඳේ එතිලා
කොහොමද අම්මේ එහෙම කරන්නේ අම්මත් සසරෙන් එතෙර වෙලා

[අසන්න ගීතය]

සංගීතය - සනත් නන්දසිරි පද - ප්‍රියානන්ද විජේසුන්දර



www.studentlanka.com

# සනත් නන්දසිරි - මේ ප්‍රථම වසන්තයයි

මේ ප්‍රථම වසන්තයයි
දිවි අරණේ මදු මල් පිපෙනා
බිඟු රැව් නැගෙනා
මේ ප්‍රථම වසන්තයයි

තරු මැවෙන තුරා නිදි බර අඹරේ
සඳු නැගෙන තුරා සිටියදී අඳුරේ
ඔබ සුපුන් සඳක් සේ පායා
පහන් රැයක් වී ආවේ

මේ ප්‍රථම වසන්තයයි ........

සිත පවස දරා මිරිඟුව අතරේ
දිය පහස පතා සිටියදී කතරේ
ඔබ සිහිල් දොළක් සේ පාවී
වසන්තයක් වී ආවේ

අසන්න ගීතය

පද - කුලරත්න ආරියවංශ සංගීතය - සනත් නන්දසිරි



www.studentlanka.com

# සනත් නන්දසිරි - සොවින් පිරි මගේ හදවත

සොවින් පිරි මගේ හදවත තුලින් මතු වේවි පිටවන
හැඟුම් කැටි ගැසී ගෙන එයි සිතට වේදනා
සුවෙන් මා එදා සැතපු යහන් මත මහත් විස කටු
තිබෙන්නාවූ ලෙසට දැනෙයි ගතට වේදනා

ගතත් වේදනාවෙන් පිරි සිතත් සෝ දුකින් බර වී
දෙනෙත් අඳ නොවී තිබුනත් ඉනුත් නැහැ සුවේ
කනත් බිහිරි වී නැති මුත් අමුත්තක් වෙලා නැහැ කිසි
එහෙත් ඉන් හොඳක් මිහිරක් මෙතෙක් නැහැ ඇසි //

දෙඅත් සහ දෙපා කොර වී නැතත් ඉන් ලබන්නට හැකි
කිසිත් සම්පතක් සතුටක් මෙතෙක් නැහැ ලැබී
මිහිරි යන වදන පමණක් අසා ඇති නමුත් ඒ තුල
ඇහිරිලාතිබෙන අරුතක් මෙතෙක් නැහැ ඇසී

අසන්න ගීතය

පද - පියල් ප්‍රේමනාත් ජයතිලක සංගීතය - සනත් නන්දසිරි



www.studentlanka.com

# සේනානායක වේරලියද්ද - මීන නුවන් යුග

මීන නුවන් යුග කඳුළු සලා ගෙන
දුරු කතරේ තනි වූ යුවතී
නිදි නැති රෑ සුසුමන් පවනේ
ගැයූ ගී මී බඳුනේ රැඳුනේ //

බාලේ ඉඳන් පෙම් සිතුවම් ඇඳි
අද වෙන් වී නුඹ හිම පියසේ
කාල වළා නැග එන්නා නබෝ ගැබ //
බොඳ වී යයි මුදු වදන් මෙදා //

මීන නුවන් යුග ......

සීත රටේ තනි මලට ලොවින්
ඇත ඉඳන් ආ බඹරින්දු
දෑසේ වෙලී සැඟවෙන්න වගෙයි අද
මාලවිකා මා බාල ලියේ

අසන්න ගීතය



www.studentlanka.com

# සේනානායක වේරලියද්ද - නන්දනීය පෙම

නන්දනීය පෙම සැඩ  රළු දියඹ වෙස්වලා
නින්ද පාවෙලා නෙතදර නුඹ හරස් වෙලා //

කෙන්ද කන්ද වී ලෝකයේ නෙත විවර වෙලා
අන්ද මන්ද වී සිත් මල් තැලී  පොඩි වෙලා
බැන්ද පෙම් රැහැන්  එකිනෙක ලිහී ගිලිහිලා
මන්ද මේ මුසා බසකට ඔබ මුලා වෙලා

ලන්ද  වන පෙතේ කෝකිල ගැයුම  ගොළු වෙලා
මන්දහාසයෙන්   මුව මඩල මැලවිලා
දැන්ද  සුව ගෙනේ විඳි සුව හදට ලංවෙලා
සුන්දරයි කියා පතු හැම දෙයම සුන්වෙලා //

අසන්න ගීතය

පද  - නන්දා උඩවත්ත

සංගීතය - සිරිල් පෙරේරා



www.studentlanka.com

# ශාලිත අබේවික්‍රම - පිපුණු මලක හැඩ

පිපුණු මලක හැඩ දෑස සලා
සිතුම් විහඟ කැල වසඟ කළා
මග තොට රැඳී නෙත් දහක් වසා
මතකද අප නෙත් කතා කළා

කවුරුද ඔබ මා ඉන්නේ කොතැනා
නොම විමසා පෙම ඉඟි මැරුවා
සොඳුරු වසන්තෙක මොහොතක සුව පා
වෙන් වුවා අප සුසුම් දරා

මතකේ මැවෙනා පෙර රූ වායා
හමු වේදෝ යලි සිත සනහා
ඔබ නමටයි මා පාරමී පුරනා
අසේවිදෝ මේ ගී මාලා

අසන්න ගීතය

පද - විපුල ධර්මප්‍රිය ජයසේකර
සංගීතය - ශාලිත අබේවික්‍රම



www.studentlanka.com

# සිසිර සේනාරත්න - මාගේ පුතුට මල්

මාගේ පුතුට මල් යහන සදන්නේ
දෑස සිහින වැල් පාවී එන්නේ
රෝස කැලේකින් හමුවූ වැන්නේ
මට මේ කුමරුන් කවුදෝ දුන්නේ

පුංචි පුතුනි ඇයි කිරට හඬන්නේ
කව්ද පුතුට ලේ කිරි කර දෙන්නේ //
අම්ම කියාලයි බහ තෝරන්නේ
ඒ සුදු අම්මා කොහේදෝ ඉන්නේ

මවගේ ලමැද ලේ කිරට පෙරෙන්නේ
ඒ කිරි සුවඳයි ලොව පවතින්නේ
පුතුගේ සිනාවෙන් සතුට මැවෙන්නේ
මල් යානාවේ පුතු නැළවෙන්නේ
මට මේ කුමරුන් කවුදෝ දුන්නේ

**සංගීතය - සිසිර සේනාරත්න**

අසන්න ගීතය



www.studentlanka.com

# සෝමතිලක ජයමහ - අපි ආයෙත් හමු නොවුනා

අපි ආයෙත් හමු නොවුනා නම්
ඉස්සර දවසක මියගිය සෙනෙහස
යලි ඉපදී මා හද  හඬවන්නට
අපි ආයෙත් හමු නොවුනා නම්

ඔබ නාදුනනා විරහ වේදනා
පෙර දා වින්දේ මා පමණයි
හුහ කලකින් හමු වී සෝ ලතැවුල්
අදත් විඳින්නේ මා පමණයි

සමු ගන්නට නම් අහිමි ආදරෙන්
ආයෙත් ඇයි  අප හමුවන්නේ
ආදරයේ කඳුලින් මිය යන්නද
ජීවිත ඉරණම විසඳෙන්නේ

අසන්න ගීතය

පද - අජන්තා රණසිංහ        සංගීතය  - වික්ටර් රත්නායක



www.studentlanka.com

# සුජාතා අත්තනායක - පරවුණු මල් වල

පරවුණු මල් වල සුවඳ අතිතේ
පරසතු මල් ළඟ විසිර ගියාවේ
දුවගේ මුවින් එන කැකුළු සිනාවේ
එලිය මැදින් හෙට දවස උදාවේ

අතට වළලු  මම කොහෙන් සොයම්දෝ
පයට ගිගිරි මම කොහෙන් සොයම් දෝ
ඉනට හවඩි මම කොහෙන් සොයම්දෝ
දුවට මවක මිස පියෙකු කොහින්දෝ

දහවල ගෙවිලා අඳුර ගලනවා
ඈත ලොවක නිදි දෑස පෙනෙනවා
හීතල පාළුව ඉවුඩු පිපෙනවා
ඒ අතරින් දුව දොරට වදිනවා

අසන්න ගීතය

සංගීතය - ලයනල් අල්ගම



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - අලුත් වැස්සක්

අලුත් වැස්සක් වහින්නට සැරසේ
පුරුදු ආකාසේ
දිගු කාලයක් නිහඬ වී සිටි නුඹ වගේ
අලුත් වැස්සක් වහින්නට සැරසේ

අහස වැසි වසිනා නුමුත්
කවදාද ඒ වැහි වහින්නේ නොදනිමි
නියං කල සැමදා නැතත්
කවදාද නියඟය ගෙවෙන්නේ නොදනිමි

දුකක් වින්දොත් සැපක් ළඟමයි
දිය දහම ඒ විලසයි

අලුත් වැස්සක් වහින්නට සැරසේ

වලාකුළු අහසට ඇවිත්
මොනවාද මේ හැටි කරන්නේ සරදම්
ඇහේ තෙරපෙන දුක නිවා කවදාද වැහි බිඳු
ගෙනෙන්නේ සැනසුම්
දුකක් වින්දොත් සැපක් ළඟමයි
දිය දහම ඒ විලසයි

අලුත් වැස්සක් වහින්නට සැරසේ

[අසන්න ගීතය]



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - කුඩා ගමේ මද්දහනේ

කුඩා ගමේ මද්දහනේ අව් රශ්මිය නිවා
කුරි කඳු පෙතේ දඩමන් දිගේ ගියා මෙමා
එවන් ගමන් මා නම් ගියෙ සෙනෙහස ගැන සිතා
නුඹේ කරට රිදී පොටක් පළඳන්නයි සුබා

මගේ පැලට නුඹ කැන්දන් පැමිණි දොහේ එදා
මල් ගෝමර පිපුණු ලමැද වසා ගනින් කියා
මගේ අතින් දුන් සළුවෙන් ලමැද වසා තියා
රිදී පොටක් පළඳන්නට වරම් නැතුව ගියා

ආල වඩන අකුරු පහේ තෙරෙවිල්ල සකී
රැට නිදන තනි පැදුරේ නැති සිහිනෙකි සකී
ආලේ බිඳුණු දා කුමකට කඳුළු සලනු සකී
ආල වඩන යන තේරුම බෝසත් කම සකී

[අසන්න ගීතය]

**සංගීතය - වික්ටර්** රත්නායක **පද - ධර්මසිරි ගමගේ මැතිතුමා**



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - මහා වැස්සක් බිමට හලා

මහ වැස්සක බිමට හලා නිදහස් වූ අහසක් සේ
ඔබ නිසොල්මනේ එපා හිඳින්න
ඔබේ නිහඬ බව මට බැහැ දරාන ඉන්න
අනේ තව ටිකකින් හිනා වෙලා කතා කරන්න
ඔබේ නිහඬ බව මට බැහැ දරාන ඉන්න

විරසක සුසුම් මහා ගෙයි පුරා ඇසෙන්නේ
කවුළු දොරින් ගෙට එන නිදි නැති අටවක සඳ
තනි යහනේ සරදම් රටා වියන්නේ

මහ වැස්සක බිමට හලා.........

විස කටු ඇණී ආතුර වූ සිතට ඔබේ
ඔබ මට කියා දුන්න සෙත් කවියක් කියන්න
නිවැරදි මිනිසුන් කොයි දෙසද ඉපදුනේ

[අසන්න ගීතය]

පද - සුනිල් දයානන්ද කෝණ්ණාර



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - පාරු පාලමෙන්

පාරු පාලමෙන් කොළඹට ගැල් පේලිය සැපත් වුනා
ගැස් පහට ලං වෙනකොට අපි හොඳම හවස් වුනා
සෙක්කු වීදියේ කම්බා දැක නුඹ මට මතක් වුනා
කයිමන් දොරකඩ ඉඳපන් මං එනතුරු සෙලෙස්තිනා

කොළඹ රටේ ඉපදුනාට මටම ඔබින සෙලෙස්තිනා
බේරේ වැවට හඳ පෑව්ව වාගෙයි මට ඔබේ සිනා
කබා කුරුත්තාව ඇඳන් මුතු දෙපටක් ගෙලේ දමා
සාන්ත බස්තියන් ඇලේ පාරු පදිමු සෙලෙස්තිනා

පාමංකඩ කවි මඩුවක් හෙට හවසට පැවැත්වෙනා
නම් දරාපු කවි කාරයෝ එහි එන බව කතා වුනා
ට්‍රෑම් කාර් එකේ ගිහින් කවි අහමුද සෙලෙස්තිනා
ඉංගිරීසි රැජින වගේයි මට නම් නුඹ සෙලෙතිනා

[අසන්න ගීතය]

පද - අසෝක කෝවිලගේ සංගීතය - රෝහණ වීරසිංහ



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - පැන මැඩ කඩිති

පැන මැඩ කඩිති වැවු තාවල වැහි කාලේ
පෙන්නා මග නොමග නොවැටී යන තලේ
සිප් කිරි පෙවූ මූසිලයන් උඩු මාලේ
අපෙ  ගුරුතුමා යයි තාමත් ඉස්කෝලේ

සාමා අමර විකුණති බස් පොලේ කජු
කුමාරෝද පිටු දත් දෙති එයින් මතු
උගත මනා ශිල්පය පිල් කඩ නොපැතූ
වේවැල වනා ඉකි බිඳ දඬුවමක් පතු

රන් මසු පට පිළී අබරණ උරණ වෙලා
සමන් පිච්ච කැකුලිය ගෙයි මිලන වෙලා
ගුරු නිවහනේ කඳුලට උල්පතක් වෙලා
ලොකු හාමිනේ ඇත බිතු සිතුවමක් වෙලා

අසන්න ගීතය



www.studentlanka.com

# සුනිල් එදිරිසිංහ - රන්මැලි සැය විය

රන්මැලි සැය විය දිවි අඹරට නැගුණ
සුදොවුන් පියා විය සක්විති මග තනන
සමනල පව්ව විය දුක සැප සම ගලන
පිය මහ රජුනි අප ගෙපැලේ රජ කරන

අසනි වැසි රුදුරු වග වලසුන් අතරේ
සිව් මහ දෙවිඳු වී නීති රැකවල් සැදුවේ
හිරුටත් කලින් අවදිව කෙත් වත් තැනුවේ
බෝසත් පාරමී ගුණයෙනි අප වැඩුවේ

බුදුදස් නිරිඳු සේ අත් බෙහෙතක් හදලා
පැල ඉණි වැටෙන් ගණපති රූපය ඇඳලා
තුසිතෙක ඉසුරු පැලවට සිව්කොළ තබලා
ලොව්තුරු සුව වීදී අප රජවනු දැකලා

[අසන්න ගීතය]()

පද -පූජ්‍ය කිරම සුමංගල හිමි

සංගීතය - මනෝරි උග්ගලගේ



www.studentlanka.com

# සුනිල් ශාන්ත - දිය ගොඩ හැම තැන

දිය ගොඩ හැම තැන කිරි ඉතිරේ ගස් වැල් කිරි මුහුදේ ඉතිරේ
මඳ මුදු සුවඳින් අප නැළවෙන්නේ බැබළෙන හඳපානේ
හඳපානේ හඳපානේ හඳපානේ රෑ යාමේ

මගෙ පොඩි නංගී කිරි ඉල්ලා දෝත නගා මා ඉහළ බලා
අම්බිලියෝ කියමින් නැළවෙන්නේ බැබළෙන හඳ පානේ

දිය මතුපිට කිරි රැල්ල නැගේ ඔරුවක් තනි වී ඈත පෙනේ
හෝ ගා මුහුදේ රැල්ල බිඳෙන්නේ බැබළෙන හඳපානේ

වවුලන් ගේ බකමූණන් ගේ නාදය ඉඳහිට මටද ඇසේ
කිරි වෙනුවට ගොම සොයමින් යන්නේ බැබළෙන හඳ පානේ

[අසන්න ගීතය]



www.studentlanka.com

# ටී. එම. ජයරත්න - අම්මා සඳකි

අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී
ඒ ඉර හඳෙන් ඔබේ ලෝකය එළිය වුනී
රැකුමට පුතුන් දිවියේ දුක් ගැහැට විඳී
පිය සෙනෙහසට ගී කවි ලියවුනා මදී

සිරුරේ දුවන්නේ මගෙ ලේ නොවැ පුතුනේ
කුසයේ නොදැරුවත් දිවි බර මට දැනුනේ
මහ මෙරකට උසයි දරු පෙම හද පතුලේ
පුදුමයි පුතුනි කීම මගෙ ලේ කිරි නොවුනේ

මවකට මුවා වී නුඹ වෙත දිරි දුන්නේ
මම වෙමි පුතුනි එය මා පමණයි දන්නේ
පිය සෙනෙහස නැතිද දරුවනි හඳුනන්නේ
අම්මා වරුන් පමණද මතු බුදු වන්නේ

අසන්න ගීතය

පද - මාලිනි ජයරත්න සංගීතය - රෝහණ වීරසිංහ



www.studentlanka.com

# වික්ටර් රත්නායක ශ්‍රීමති තිලකරත්න
# ආදර ගඟුලේ

ආදර ගඟුලේ ඉව්රේ රැඳී සහන පවන් සැලූ
මා ළඟ ඔබ සිටිනා විටදී ලොවම දැකුම්කළු //

මල් වල වන විල් පිරී ගියේ සෙවන දෙවන්නලු
බිඟු නද විහඟුන් ඉගිල්ලුනේ මිහිරේ රැදෙන්න ලූ
පුන්සඳ නැඟුනෙත් අහස් තලේ අපට බලන්න ලූ
දෙනෙතට කඳුළැලි තුරුල් කලේ පෙමට හඬන්න ලූ

ආදර ගඟුලේ ඉව්රේ .....................

මී වද මී පැණි පිරී ගියේ දෙතොලේ රඳන්න ලූ
දේදුනු ඔව්ලි නැව් ගියේ නුවන පිනන්න ලූ
මේ ලොව මා ඉපදුනේ ප්‍රියේ ඔබව ලබන්න ලූ
ඒ හැර ලැබුනත් පලක් නැතේ ඉසුරු මැණික් මලු

අසන්න ගීතය



www.studentlanka.com

# වික්ටර් රත්නායක - අපි ඈතට ඈතට

අපි ඈතට ඈතට  පා නැගලා ගන වනන්තරේ
අතරමං වෙමු වසන්ත මල් ගොමුවේ

කාත් කවුරුවත් නෑ එන්නේ
ඉඳුල් නොවේ රුදු මිනිස්
ඇසින්අපේම පුංචි ලෝකයේ අපි ඉන්නේ
බඹරුන් විතරයි තනියට ළඟ ඉන්නේ

අපි ඈතට ඈතට ...................

කෙසේද අත් බැඳ ඇවිදින්නේ
වෙරළේ උයනේ තුරුළු වෙමින්
නෑ සිය මිතුරන් මග තොට හමුවන්නේ
උකුසු ඇසින් අප කෙලෙසද ගැලවෙන්නේ

අපි ඈතට ඈතට ...................

අසන්න ගීතය

පද - මහාචාර්ය සුනිල් ආරියරත්න     සංගීතය  -  වික්ටර් රත්නායක



www.studentlanka.com

# වික්ටර් රත්නායක - අපි හැඟුම් වලට

අපි හැඟුම් වලට ඉඩ දී මොහොතක්
ඉඩ ලබා ගනිමු තරමින් වියතක් //
හඳපානේ මඳ අඳුරේ අත් පටලා යමු ආයේ

( ඔබ ඔබේ හෙවනැල්ලෙන් මිදී
මම මගේ හෙවනැල්ලෙන් මිදී ) //

අවුදින් හෙමින් රහසින් මුමුණා හඳපානේ මඳ අඳුරේ
හඳපානේ මඳ අඳුරේ අත් පටලා යමු ආයේ

හිරකර හසරැල්ලෙන් හැඬුම් අපි හිනැහෙමු සපුරා පැතුම්
මතු ආත්මයේ හමුවන පතුමින් යමු වෙන්වී හිමිදිරියේ

හඳපානේ මඳ අඳුරේ අත් පටලා යමු ආයේ //

අසන්න ගීතය

පද - ප්‍රේමකීර්ති ද අල්විස් සංගීතය - වික්ටර් රත්නායක



www.studentlanka.com

# වික්ටර් රත්නායක - මල් ලියකම් රැඳි

( චූඩා මාණික්‍යය )

මල් ලියකම් රැඳි පෙම් සිතුවම් ඇඳි //
ආදර විජිනි පතින් කව්දෝ සිහිල් පවන් සලනා
කියා ගන්න බැරි නුහුරු හැඟුම්
ඔබේ නුවන් පුරා ඇදෙනා

ඔච්චම් කර මල් කුමර කුමරියෝ අප වටකර හිනැහෙන්නා
කිඳුරු කොදෙව්වේ මුතු පායේ හැන්ගෙමු අපි දෙන්නා
හැන්ගෙමු අපි දෙන්නා

රත්තරනින් සැදි කේතකී මං පෙත
අත්වැල් බැඳ යමු රත්තරනේ
පිච්ච මලින් පිරි ලෝකය අපටයි

ස්වපන පරාදිසේ සුරංගනාවියේ //

අසන්න ගීතය Clip from the movie

පද - අජන්තා රණසිංහ සංගීතය - සරත් දසනායක



www.studentlanka.com

# වික්ටර් රත්නායක - සිහින සතක් දුටුවෙමි

සිහින සතක් දුටුවෙමි මම සත් දවසක් එක දිගටම
එක සිහිනෙක ඔබ දුටුවා සිඟන්නියක සේ සිඟන්නියක සේ

ඔබ මගේ පැල්පතට පැමිණ
ආයාචනයක් කරමින්
ජීවත් වන්නට කිසිවක් ඉල්ලා සිටියා

කිසිවක් දෙන්නට මට නැත තිබුනේ පිරිසිදු හදවත
සිඟන්නියේ එය ඔබ හට දුන්නා මතකයි

එදා මගේ හද අරගත් ඔබ
අද මට වැඩි පොහොසත්
ඒ හින්දා මටත් එලෙස පිහිට වනු මැනේ

පද - ප්‍රේමකීර්ති ද අල්විස් සංගීතය -

[අසන්න ගීතය]



www.studentlanka.com

# උමාරා සිංහවංශ - වස්සානයට අත වනල

වස්සානයට අත වනල ඉමු මග බලන්
උද්‍යානයක කෙලවරට වී
ඔබ ඇතින් ඉඳන් ඉන්නවද රත්තරන්
මං ගාවින් ම උණුහුම නොදී

හාදු දෙන වැස්සේ දේදුන්න අස්සේ
අපි පාවෙමුද තුරුලටම වී
ඔබේ ඇස් අස්සේ මං මාව දැක්කේ
සංසාරයම මම නුඹ ගේ වී
තව ඇතින් ඉඳන් ඉන්නවද රත්තරන්
සංසාරය ම මෙය මට නොදී

වැට කඩුලු අස්සේ මල් පිපුණු බිස්සේ
අපි හැන්ගෙමුද උනුහුමට වී
සමනලුන් පස්සේ දුව පැනපු කාලේ
දැන් මට දෙන්න නුඹ මගේම වී
ඇයි ඇතින් ඉඳන් ඔය තරම් රත්තරන්
මං ආවොත් ද නුඹ මට හිමි

[අසන්න ගීතය]



www.studentlanka.com

# W.D. ආරියසිංහ - මා ළඟටම තව ලං වෙලා

මා ළඟටම තව ලං වෙලා ඉඳින්න නිහඬ නුවන් පියා
මා සීතාවෝ සැතපෙන නින්දේ නූපුර හෝ ප්‍රියේ
පා සුළඟිල්ලේ අද නම් අවදි නොවේ
කුසුම් කැකුළ නිදනා තුරා

සඳ ගිරි පව්වේ පෙර දා සංසාරේ
සැතපෙනවා දුටු කින්නර පෙම් සිහිනේ
මහලු වෙලා අද සඳ වාගෙයි
යව්වන රෑ සඳු බලාන උන්නාවේ

කල්ප කාල යුග අප අතරින් ගෙවිලා
අපි යමු මේ රෑ අනාගතය සොයලා
නල මුදු සුවඳේ නිදන මලේ
මට මල් රොනගුළු සුවඳ දැනෙයි ළඳුනේ

අසන්න ගීතය



www.studentlanka.com

[Gramophone Music from Ceylon]

[Old Sinhala Buddhist songs from Ceylon]

[Maestro Premasiri Khemadasa - Pirinivan Mangallaya]

[Maestro .Premasiri Khemadasa - Golu Hadawatha Theme]

[Brahm Naad - 1200 Sitarists Perform Led by Bansuri (Flute) Player]

[Antarnaad : Guinness World Record, 2750 Classical Vocalist]



www.studentlanka.com